*සැ. යු.-* 2022.12.02 දින පළ කරන ලද අංක 2309 *ගැසට් පත්‍රයේ* IV(අ) කොටස් පළ නොවී ය.

# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය


**අංක 2,310 - 2022 දෙසැම්බර් මස 09 වැනි සිකුරාදා - 2022.12.09**

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


## I වැනි කොටස : (IIඅ) වැනි ඡෙදය - පළකිරීම්

(වෙන වෙනම ගොනු කර ගත හැකි පරිදි සෑම කොටසකට ම අයත් එක් එක් භාෂාවකට වෙන වෙනම පිටු අංක යොදා ඇත)


| | පිටුව | | පිටුව |
|---|---|---|---|
| තනතුරු ඇබෑර්තු .... ... ... | 2142 | විභාග, විභාග ප්‍රතිඵල ආදිය ... ... ... | 2149 |


**සතිපතා නිකුත් වන ගැසට් පත්‍රයෙහි පළකිරීම සඳහා භාරගනු ලබන දැන්වීම් පිළිබඳ**

**වැදගත් නිවේදනයයි**

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රයේ* අවසන් පිටුවේ සෑම මාසයක ම මුල් සතියේ දී පළ කරන නිවේදන භාරගන්නා දිනයන් සහ වේලාවන් පිළිබඳව මින් අවධානය යොමු කරනු ලැබේ.

*ගැසට් පත්‍රයේ* පළ කිරීම සඳහා දැන්වීම් භාරගැනීම *ගැසට් පත්‍රය* පළකරනු ලබන දිනයට සති දෙකකට පෙර සිකුරාදා දිනයෙහි දහවල් 12.00 ට අවසන් කරනු ලැබේ. තනතුරු - ඇබෑර්තු, විභාග, ටෙන්ඩර් සහ වෙන්දේසි පිළිබඳ දැන්වීම්වල අවසන් දින සහ වේලාවන් ඒ පිළිබඳව උනන්දුවක් දක්වන අයට ප්‍රමාණවත් කාල වේලාවක් ලැබෙන පරිදි යොදාගත යුතු බවට, සියලු ම දෙපාර්තමේන්තු, සංස්ථා සහ මණ්ඩල යනාදිය වගබලාගත යුතු බව මින් අවධාරණය කෙරේ. පළකිරීම සඳහා එවනු ලබන සෑම දැන්වීමක් ම තනි පැත්තේ පමණක් පැහැදිලිව පිටපත් කළ යුතු ය. **නිරවද්‍යතාවය පිළිබඳව කරන විමසීම් සහ පැමිණිලි ගැසට් පත්‍රය පළ වූ දින සිට තෙමසකට පසුව භාරගනු නොලැබේ.**

ගැසට් පත්‍රයේ පළ කරන සෑම දැන්වීමක් ම ගැසට් පත්‍රය පළ කරනු ලබන දිනට සති දෙකකට පෙර එනම්, 2022 දෙසැම්බර් මස 30 වැනි දින පළකරන *ගැසට් පත්‍රයේ* දැන්වීම් 2022 දෙසැම්බර් මස 16 වැනි දින දහවල් 12.00ට හෝ ඊට පෙර තැපෑලෙන් හෝ ගෙනවිත් රජයේ මුද්‍රණාලයට භාරදිය යුතු ය.

**2006 අංක 19 දරන ඉලෙක්ට්‍රොනික ගනුදෙනු පනත - 9 වැනි වගන්තිය**

*"යම් ප්‍රකාශනයක්, රීතියක්, නියෝගයක්, නියමයක්, අතුරු ව්‍යවස්ථාවක්, නිවේදනයක් හෝ වෙනත් කිසිවක් ගැසට් පත්‍රයේ පළ කළ යුතු බවට යම් පනතකින් හෝ නීති ප්‍රඥප්තියකින් විධිවිධාන සලස්වා ඇති අවස්ථාවක, ඒ රීතිය, නියෝගය, නියමය, අතුරු ව්‍යවස්ථාව, නිවේදනය හෝ වෙනත් දෙය ඉලෙක්ට්‍රොනික ස්වරූපයේ වන ගැසට් පත්‍රයක පළ කරනු ලැබුවහොත් ඒ විධිවිධානය සම්පූර්ණ කර ඇත්තාක් සේ සැලකිය යුතු ය."*

**ගංගානි ලියනගේ,**
රජයේ මුද්‍රණාලයාධිපති.

2022 ජනවාරි මස 01 වැනි දින,
කොළඹ 08,
රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ දී ය.

මෙම ගැසට් පත්‍රය *www. documents.gov.lk* වෙබ් අඩවියෙන් බාගත කළ හැක.


2139 - B 82404 — 5,403 (2022/11)

## ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයෙහි පළ කරනු ලබන රාජ්‍ය සේවා පත් කිරීම්වලට අදාළ වන පොදු කොන්දේසි

**අවශ්‍ය සාමාන්‍ය සුදුසුකම් :**

1.1 තමා ශ්‍රී ලාංකිකයෙකු බවට ප්‍රමාණවත් සාක්ෂි සෑම අයදුම්කරුවකු විසින් ම ඉදිරිපත් කළ යුතුය.

ශ්‍රී ලාංකික යනුවෙන් අදහස් කෙරෙනුයේ ලංකා පුරවැසි පනතේ අර්ථ දක්වා ඇති පරිදි පාරම්පරික වශයෙන් හෝ ලියාපදිංචි කරවා ගැනීමෙන් හෝ ශ්‍රී ලංකාවේ පුරවැසිකම් ලැබූවෙකි.

1.2 ජ්‍යෙෂ්ඨ පාඨශාලා සහතික පත්‍ර විභාගයෙන් හෝ ඊට සමාන හෝ ඊට වඩා උසස් විභාගයකින් සමත් වී තිබීම අවම අධ්‍යාපනික සුදුසුකමක් වශයෙන් නියම කොට ඇති යම් තනතුරක් සඳහා ඉල්ලුම් කරන අයදුම්කරුවෙකු සිංහල හෝ දෙමළ හෝ මාධ්‍යයෙන් අධ්‍යාපනය ලැබූ අයෙකු වේ නම්, ඔහු ජ්‍යෙෂ්ඨ පාඨශාලා සහතික පත්‍ර විභාගයෙන් හෝ ඊට සමාන විභාගයකින් හෝ සිංහල හෝ දෙමළ හෝ භාෂාව විෂයයෙන් අවස්ථාවෝචිත පරිදි සමත් වී සිටිය යුතු ය. (1961 ජනවාරි මස 01 වැනි දිනට පෙර දිනක සිට රාජ්‍ය සේවයෙහි යෙදී සිටින්නාවූත් රාජ්‍ය සේවයෙහි වෙනත් තනතුරුවලට ඉල්ලුම් කරන්නාවූත් නිලධාරීන් විෂයයෙහි මෙම නියමය අදාළ නොවන්නේ ය.)

*1.3 අයදුම් කරනු ලබන තනතුර සඳහා නියමිත ඉහළම රාජ්‍ය භාෂා ප්‍රවීණතා පරීක්ෂණවලින් නිදහස් කිරීමට හිමිකම් ලබන සුදුසුකම් පසු කලක දී ලබා තිබේ නම් මිස, නියමිත රාජ්‍ය භාෂා ප්‍රවීණතා පරීක්ෂණය සමත්වීමට අපොහොසත්වීම නිසා පරිවාස/පරීක්ෂණ කාලයකට යටත්ව දෙන ලද සිය පත්වීම අවසන් කරනු ලැබූ, සිංහල හෝ දෙමළ හෝ නොවන භාෂා මාධ්‍යයකින් රජයේ සේවයට ඇතුළත්ව සිටි නව ප්‍රවේශක නිලධාරීන්ගෙන් ලැබෙන අයදුම්පත් භාරගනු නොලැබේ.

**2. සේවා කොන්දේසි - සාමාන්‍ය :**

2.1 රාජ්‍ය සේවයෙහි යෙදී සිටින සියලු ම නිලධාරීහු මුදල් රෙගුලාසි, ආයතන සංග්‍රහය, දෙපාර්තමේන්තු නියෝග හෝ රෙගුලාසි සහ රජය විසින් වරින් වර නිකුත් කරනු ලැබිය හැකි වෙනත් නියෝග හෝ රෙගුලාසිවලට යටත් විය යුත්තා හ.

2.2 අදාළ අමාත්‍යාංශයෙහි ලේකම් විසින් තීරණය කරනු ලැබිය හැකි ප්‍රමාණයේ මුදලක් එම ලේකම් විසින් තීරණය කරනු ලැබිය හැකි අන්දමකින් ඇප තබන ලද රාජ්‍ය සේවා නිලධාරීන්ගේ (ඇප) ආඥාපනත යටතේ රාජ්‍ය නිලධාරියකුට නියම කරනු ලැබිය හැකි ය.

2.3 දිවයිනේ ඕනෑ ම තැනක සේවය කිරීමට රාජ්‍ය නිලධාරියෙකුට නියම කරනු ලැබිය හැකිය.

**3. ස්ථිර පත්වීම් දරන රාජ්‍ය නිලධාරීන්ට අදාළ සේවා කොන්දේසි**

3.1 ස්ථිර පත්වීම් දරන රාජ්‍ය නිලධාරිහු පූර්වෝක්ත 2 වැනි වගන්තියේ සඳහන් කොන්දේසිවලට අතිරේක වශයෙන් පහත දැක්වෙන අනිකුත් කොන්දේසිවලට ද යටත් විය යුතුය.

3.1.1 යම්කිසි තනතුරක පරිවාස කාලය අවුරුදු තුනකට වැඩි විය යුතු යැයි සලකනු ලබන්නේ නම් විනා එසේ නොමැති නම් සියලු ම පත් කිරීම් අවුරුදු තුනක පරිවාස කාලයකට යටත් වනු ඇත. පරිවාස කාලය තුළ හේතුවක් නොදක්වා සේවය නතර කරනු ලැබිය හැකිය.

3.1.2 සියලු ම රාජ්‍ය නිලධාරීහු රාජ්‍ය භාෂා ප්‍රතිපත්තියෙහි අවශ්‍යතාවයන් සඳහා ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ IV වන පරිච්ඡේදයේ විධිවිධාන සහ රජයේ භාෂා ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කිරීම සඳහා දැනට පවත්නා වූ සහ මින් මතු පනවනු ලබන්නාවූ අනෙකුත් නීති, රෙගුලාසි සහ ව්‍යවස්ථා ද පිළිපැදිය යුත්තාහ.

3.1.3 රාජ්‍ය භාෂාවකින් වැඩ කිරීමට හැකිවන අන්දමේ දැනුමක් තමන්ගේ පරිවාස කාලය ඇතුළත ලබාගන්නා ලෙස සිංහල හෝ දෙමළ නොවන භාෂා මාධ්‍යයකින් රාජ්‍ය සේවයට ඇතුළත් වූ නිලධාරීන්ට නියම කෙරේ.

3.1.4 සිංහල හෝ දෙමළ හෝ නොවන වෙනත් භාෂා මාධ්‍යයකින් සේවයට ඇතුළත් වූ නිලධාරියෙකු පරිවාස කාලය අවසානයේ දී තනතුරෙහි ස්ථිර කරනු ලැබීමට අදාළ වන වෙනත් කරුණු අතර, අවුරුද්දක් ඇතුළත කවර හෝ රාජ්‍ය භාෂාවකින් නියමිත ප්‍රවීණතා පරීක්ෂණයෙහි I වැනි ශ්‍රේණියෙන් සමත්වීමත්, අවුරුදු දෙකක් ඇතුළත II වැනි ශ්‍රේණියෙන් සමත්වීමත් (අවශ්‍යනම්) අවුරුදු තුනක් ඇතුළත III වැනි ශ්‍රේණියෙන් සමත්වීමත් බලපවත්වනු ඇත.

නියමිත කාල සීමා ඇතුළත දී පරීක්ෂණයකින් අසමත් වුවහොත් වැටුප් වර්ධකයක් තාවකාලිකව අත්හිටුවනු ලැබිය හැකි ය. නියමිත කාලසීමාව ඉක්මවා තව මාස හයක කාලසීමාවක් ඇතුළත යථෝක්ත පරීක්ෂණයෙන් සමත්වීමට අසමත් වුවහොත් එසේ වැටුප් වර්ධක තාවකාලිකව අත්හිටුවීම, වැටුප් වර්ධක නතර කිරීමකට පරිවර්තනය කෙරෙනු ඇත. පරීක්ෂණයෙන් සමත්වන තෙක් හෝ පහත දැක්වෙන 3.1.6 වැනි වගන්තියේ විධිවිධානයන් බලපවත්වන තෙක් හෝ යථෝක්ත වැටුප් වර්ධකයන් නතර කිරීම ක්‍රියාත්මක වන්නේය.

3.1.5 මෙවැනි නිලධාරීන්ට පත්වීම ලැබීමෙන් පසු රාජ්‍ය භාෂාවක ප්‍රවීණතාවය ලබා ගැනීම පිණිස මාස හයක කාලයක් සඳහා පූර්ණ වැටුප් සහිත පහසුකම් සැලසිය යුතුය. ඉන් අනතුරුව අදාළ ප්‍රවීණතා විභාගයට ඔහු පෙනී සිටිය යුතු අතර, එම විභාගයෙන් අසමත් වුවහොත් පූර්ණ වැටුප් සහිත මාස හයක කාල පරිච්ඡේදයෙන් පසු ඒ සමඟම එළඹෙන අවුරුදු දෙකක කාල පරිච්ඡේදය තුළ තමාගේ සාමාන්‍ය රාජකාරිවල නිරත වෙමින් සිටිය දී විභාගයෙන් සමත්වීමට ඔහුට අවස්ථාව සලසා දෙනු ලැබේ.

3.1.6 නියමිත අවුරුදු දෙකහමාරක කාල පරිච්ඡේදය තුළ විභාගයෙන් සමත්වීමට නොහැකි වුවහොත් ඔහුගේ සේවය අවසන් කරනු ලැබේ.

3.1.7 රාජ්‍ය සේවයෙහි ස්ථිර තනතුරක දැනටමත් ස්ථිර කරනු ලැබ සිටින රාජ්‍ය නිලධාරියෙකු රාජ්‍ය සේවයෙහි වෙනත් ස්ථිර තනතුරකට පත් කරනු ලැබූ විට යළි පරිවාස කාලසීමාවක් සේවය කරන ලෙස සාමාන්‍යයෙන් ඔහුට නියම කරනු නොලැබේ. එවැනි නිලධාරියෙකු සිය නව තනතුරෙහි කරන සේවය පරීක්ෂා කර බැලීම සඳහා ප්‍රථමයෙන් එම තනතුරෙහි නියමිත කාලසීමාවක් වැඩ බැලීම සඳහා ඔහු පත් කරනු ලැබිය හැකි ය.

3.1.8 (රාජ්‍ය සේවයෙහි දැනටමත් ස්ථිර/තාවකාලික තනතුරු දරන්නා වූ ද වෛද්‍ය පරීක්ෂණයකට භාජනය කරනු ලැබුවා වූ ද, අය හැර) තෝරාගනු ලැබූ අපේක්ෂකයන් දිවයිනේ ඕනෑම පෙදෙසක සේවය කිරීමට ශාරීරිකව සුදුසුද නැද්ද යනු පරීක්ෂා කිරීම පිණිස රජයේ වෛද්‍ය නිලධාරියෙකු විසින් පවත්වනු ලබන වෛද්‍ය පරීක්ෂණයකට ඉදිරිපත්වන ලෙස ඔවුනට නියම කරනු ඇත.

**4. සේවයට භාර ගැනීම පිළිබඳ කොන්දේසි**

4.1 ස්ථිර හා විශ්‍රාම වැටුප් සහිත තනතුරුවලට පත් කරනු ලබන රාජ්‍ය නිලධාරීන් විසින් ඔවුන්ගේ වැටුපෙන් අයකර ගතයුතු යැයි රජය විසින් නියම කරනු ලබන ප්‍රතිශතයක ප්‍රමාණයට සමාන මුදලක් ස්වකීය වැටුපෙන් වැන්දඹු සහ අනත්දරු විශ්‍රාම වැටුප් ක්‍රමයට දායක මුදල් වශයෙන් ගෙවිය යුතුය.

4.2 අර්ථසාධක අරමුදල් පදනම මත ස්ථිර හෝ තාවකාලික තනතුරුවලට පත්කරනු ලැබූ රාජ්‍ය නිලධාරීන් ස්වකීය ඒකාබද්ධ වැටුපෙන් 6%ක් රාජ්‍ය සේවා අර්ථසාධක අරමුදලට දායක මුදල් වශයෙන් ගෙවිය යුතු වන්නේ ය. මුදල් වර්ෂය අවසානයේ දී අනිවාර්ය දායක මුදල් වශයෙන් අරමුදලට බැරකර ඇති මුදල් ප්‍රමාණය මෙන් 150%ක මුදල් ප්‍රමාණයක් රජය විසින් එම අරමුදලට රජයේ දායක මුදල වශයෙන් ගෙවනු ඇත.

4.3 පළාත් පාලන සේවයේ විශ්‍රාම වැටුප් සහිත තනතුරුවලට මුදවා හරිනු ලබන රාජ්‍ය සේවයේ විශ්‍රාම වැටුප් සහිත තනතුරු උසුලන්නා වූ නිලධාරීන් සහ රාජ්‍ය සේවයේ විශ්‍රාම වැටුප් සහිත තනතුරුවලට මුදවා හරිනු ලැබ පළාත් පාලන සේවයේ (විශ්‍රාම වැටුප් සහිත) තනතුරු උසුලන්නා වූ නිලධාරීන්හට පිළිවෙලින් ඔවුන්ගේ පළාත් පාලන සේවයේ සහ රාජ්‍ය සේවයේ තනතුරු සහ විශ්‍රාම වැටුප් හිමිකම් දෙනු ලැබේ.

4.4 විශ්‍රාම වැටුප් ව්‍යවස්ථා සංග්‍රහය යටතේ රාජ්‍ය සේවයේ විශ්‍රාම වැටුප් සහිත තනතුරුවලට මුදවා හරිනු ලැබූ යුද, නාවික සහ ගුවන් හමුදාවේ නිත්‍ය සේවයෙහි නියුතු පිරිසට ඔවුන්ගේ රාජ්‍ය සේවයෙහි තනතුරු සඳහා විශ්‍රාම වැටුප් හිමිකම් දෙනු ලැබේ. මෙම ව්‍යවස්ථා සංග්‍රහය යටතේ විශ්‍රාම වැටුප් සහිත බවට ප්‍රකාශිත තනතුරක රාජ්‍ය නිලධාරියෙක් ලෙස පත්වීමක් භාර ගැනීම සඳහා මුදා හරිණු ලැබූ සන්නද්ධ හමුදාවක යම් සාමාජිකයෙකුගේ සම්පූර්ණ වැටුප් සහිත අහිමි නොවූ සේවා කාලසීමාව මේ ව්‍යවස්ථා සංග්‍රහයේ පටහැනිව කුමක් සඳහන්ව තිබුණ ද, මේ ව්‍යවස්ථා සංග්‍රහය යටතේ ගෙවිය යුතු යම් විශ්‍රාම වැටුප් පාරිතෝෂිකයක කාර්යය සඳහා ගණන් ගත යුතු ය.

**5. යුද්ධ සේවා අනුග්‍රහය**

5.1 එක්සත් රාජ්‍ය යුද්ධාවතීරණ හමුදාවන්හි සේවා මුක්ත භටයින් ද, සහාය ගිනි නිවන, ගගන ප්‍රහාර නිවාරණ සහ මහජන ආරක්ෂක සේවාවන්හි පූර්ණකාලීන සාමාජිකයන් වශයෙන් නියුක්තව සිටි තමන්ගේම ඕනෑකමින් එම සේවාවන්ගෙන් අස්ව නොගිය අයට ද ඉහත කී සියලු සුදුසුකම් තිබේ නම් ද ඔවුන් මෙම හමුදාවන්ට බැඳී ඇත්තේ 1954 අගෝස්තු මස 15 වැනි දිනට පෙරාතුව නම් ද, ඔවුන්ගේ එම සේවාවන් සතුටුදායක ලෙස සහ අඛණ්ඩව පැවතිණි නම් ද, වයස අතින් සුදුසුකම් ලබා ගැනීම සඳහා ඔවුන්ට තමන්ගේ වයස්වලින් 1939 සැප්තැම්බර් මස 03 වැනි දින සිට 1949 දෙසැම්බර් මස 31 වැනි දින දක්වා වූ කාලසීමාව තුළ තම තමන් සේවය කළ කාලයන් අඩුකර ගැනීමට ඉඩදෙනු ලැබේ.

**6. රාජ්‍ය සේවයෙහි දැනට සේවය කරන නිලධාරීහු**

6.1 රාජ්‍ය සේවයෙහි දැනට සේවයෙහි යෙදී සිටින්නාවූත්, අවශ්‍ය සියලු සුදුසුකම් ඇත්තාවූත්, නිලධාරීන් විසින් ඉදිරිපත් කරන අයදුම්පත් ඔවුන්ගේ දෙපාර්තමේන්තු ප්‍රධානීන්ගේ මාර්ගයෙන් එවිය යුතුය. නව තනතුරු සඳහා ඉල්ලුම් කරන්නා වූ ද, රාජ්‍ය සේවයෙහි දැනට ස්ථිර තනතුරු දරන්නා වූ ද, නිලධාරීන්ගෙන් යමෙකු නව තනතුරකට තෝරාගනු ලැබුවහොත් ඒ සඳහා ඔවුන් මුදවාලිය හැකි ද නොහැකි ද යන්න එම නිලධාරීන් සේවයෙහි යෙදී සිටින දෙපාර්තමේන්තුවල ප්‍රධානීන් විසින් ඔවුන්ගේ අයදුම්පත් ඉදිරිපත් කරන විට සඳහන් කළ යුතු ය.

6.2 නියමිත වේලාවක නියමිත ස්ථානයක දී සම්මුඛ පරීක්ෂණයක් සඳහා පෙනී සිටින ලෙස අයදුම්කරුවන්ට නියම කරනු ලැබිය හැක. මේ සම්බන්ධයෙන් දැරීමට සිදුවන ගමන් වියදම් හෝ වෙනත් වියදම් ආදියත් ගෙවනු නොලැබේ.

6.3 යම්කිසි අයදුම්කරුවකු නිර්දේශ කිරීමට අදහස් කරන කෙනෙකු විසින් අයදුම්කරුට චරිත සහතිකයක් දීමෙන් එසේ කළ යුතු ය. යම් අයදුම්කරුවකු තෝරා ගන්නා පරිද්දෙන් කවර අන්දමේ වුව ද අයථා අනුග්‍රහයන් පැතීම හෝ එහිලා යම් බලපෑමක් කිරීමට තැත් කිරීම හෝ එම අයදුම්කරු නුසුදුස්සකු කරනු ලැබීමට හේතුවනු ඇත.

6.4 අයදුම්කරුගේ අයදුම්පතෙහි කිසියම් සාවද්‍ය ප්‍රකාශයක් තිබෙන බැව් ඔහු තෝරා ගැනීමට කලින් දැන ගන්නට ලැබුණි නම් ඒ හේතුවෙන් ඔහු එම තනතුරට නුසුදුස්සකු බවට පත් කරනු ලැබීමටත්, තෝරා ගැනීමෙන් පසු ඒ බව අනාවරණය වුණි නම් ඔහු රාජකාරියෙන් පහකරනු ලැබීමටත් ඉඩ තිබේ.

6.5 මෙම දැන්වීමෙහි සඳහන් වන නියමයන්ට සෑම අතින් ම අනුකූල නොවන අන්දමේ අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ.

**7. සුදුසුකම් පිළිබඳ අවශ්‍යතාවයන් සඳහා වැටුප් යන්නෙහි අර්ථ දැක්වීම**

7.1 සුදුසුකම් පිළිබඳ අවශ්‍යතාවයන් සඳහා වැටුප යන්නෙන් අදහස් කෙරෙනුයේ ඒකාබද්ධ වැටුප පමණකි. වැඩ බැලීමේ වැටුපක් හෝ දීමනා ආදිය ඊට ඇතුළත් නොවන්නේ ය.

**8. බඳවා ගැනීම සහ උසස් කිරීම සම්බන්ධ නව ජාතික ප්‍රතිපත්තිය**

පසුව නිකුත් කෙරෙන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ මගින් සංශෝධනය කිරීමට යටත්ව 1990.08.09 දිනැති අංක 15/90, 1990.03.05 දිනැති අංක 15/90(I) සහ 1990.06.15 දිනැති අංක 15/90 (II) දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛවල දක්වා ඇති ප්‍රතිපත්තියට අනුකූලව රාජ්‍ය සේවයට, පළාත් රාජ්‍ය සේවයට, රාජ්‍ය සංස්ථා අංශයට සහ රජයට සම්පූර්ණයෙන්ම අයත් සමාගම්වලට බඳවා ගැනීම සහ උසස් කිරීම 1990.01.01 වැනි දින සිට සිදුකරනු ඇත.

## විභාග අපේක්ෂකයන් සඳහා නීති සහ උපදෙස්

"1968 අංක 25 දරන විභාග පනතේ දක්වා ඇති විධිවිධානයන්ට අනුකූලව කටයුතු කිරීමට සියලුම විභාගාපේක්ෂකයින් බැඳී ඇත"

සියලු ම විභාගාපේක්ෂකයින් පහත සඳහන් නීති පිළිපැදීමට බැඳී සිටිය යුතුය. මේ නීති කිසිවක් උල්ලංඝනය කරන විභාගාපේක්ෂකයෙකුට විභාග කොමසාරිස්ගේ අභිමතය පරිදි පහත සඳහන් දඬුවම් එකක් හෝ ඊට වැඩි ගණනක් හෝ පමුණුවනු ලැබිය හැකිය :-

(i) මුළු විභාගයටම හෝ ඉන් කොටසකට හෝ නැතහොත් එක් විෂයයකට හෝ ඉන් කොටසකට පෙනී සිටීම හෝ තහනම් කිරීම,
(ii) විභාගයේ එක් විෂයයකට හෝ මුළු විභාගයටම හෝ නුසුදුස්සෙකු කිරීම,
(iii) එක් අවුරුද්දකට හෝ අවුරුදු දෙකකට හෝ කිසිම විභාගයකට පෙනී සිටීම තහනම් කිරීම,
(iv) මුළු ජීවිත කාලයේ ම විභාගයකට පෙනී සිටීම තහනම් කිරීම,
(v) සහතික පත්‍රය යම්කිසි කාල සීමාවක් තුළ තහනම් කිරීම,
(vi) විභාගාපේක්ෂකයාගේ ක්‍රියා පරිපාටිය සම්බන්ධයෙන් ඔහු ගැන වගකිවයුත්තන්ට සැලකර සිටීම හෝ විභාගාපේක්ෂකයා පොලීසියට භාරදීම හෝ ඔහුගේ ක්‍රියාව සම්බන්ධයෙන් පොලීසියට පැමිණිලි කිරීම.

විභාගයට කලින් හෝ විභාගය පවත්වාගෙන යන අතරතුර හෝ විභාගයට පසුව හෝ කොයිම අවස්ථාවකදී වුවත් එවැනි විභාගාපේක්ෂකයෙකු සම්බන්ධයෙන් ක්‍රියා කිරීමේ බලය විභාග කොමසාරිස් සතු වේ. ඒ සම්බන්ධයෙන් ඔහුගේ තීරණය අවසාන තීරණය වන්නේ ය. එහෙත් රජයේ සේවකයන් බඳවා ගැනීම සඳහා පවත්වනු ලබන විභාග පිළිබඳ ව විභාග කොමසාරිස්ගේ තීරණය රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ සමීක්ෂණයට යටත් වන්නේ ය.

1. සියලු ම විභාගාපේක්ෂකයන් විභාග ශාලාව තුළදීත් ඒ අසලදීත් විභාග ශාලාධිපතීන්ට ද, ඔහුගේ සහකාරයින්ට ද, අනිකුත් විභාගාපේක්ෂකයින්ට ද බාධාවක් හෝ අවහිරයක් හෝ ඇති නොවන ලෙස ශාන්තදාන්තව හැසිරිය යුතුය. විභාග ශාලාවට ඇතුළු වන විටත්, ඉන් පිටවන විටත් ඉතා සන්සුන් ලීලාවෙන් හැසිරිය යුතුය.

2. විභාගාපේක්ෂකයෝ විභාග ශාලාධිපතීන්ට කීකරු විය යුත්තාහ. එබැවින් ඔවුන් විභාගය පවත්වාගෙන යන අතරතුරත්, විභාගය පටන් ගැනීමට පෙරත්, විභාගය අවසන් වූ විගසත් විභාග ශාලාධිපතීන්ගේ හා ඔහුගේ සහකාරයන්ගේ උපදෙස් අනුව ක්‍රියා කළ යුතු ය.

3. විභාගයේ දී ප්‍රශ්න පත්‍රයකට උත්තර ලිවීම පටන්ගෙන පැය භාගයක් ගතවූවාට පසු මොනම කාරණයක් නිසාවත් විභාගාපේක්ෂකයෙකු විභාග ශාලාවට ඇතුළු කරගනු නොලැබේ. විභාගය පටන් ගෙන පැය භාගයක් ගතවන තුරු ප්‍රශ්න පත්‍රයට පෙනී සිටින අපේක්ෂකයෙකුට විභාග ශාලාවෙන් පිටවී යාම තහනම්ය. ප්‍රායෝගික පරීක්ෂණවලට හෝ වාචික පරීක්ෂණවලට පමා වී පැමිණෙන අපේක්ෂකයන් විභාග ශාලාවට ඇතුළු නොකිරීමට ඉඩ තිබේ.

4. සෑම විභාගාපේක්ෂකයෙකුම තමාගේ විභාග අංකය දරන ආසනයේ හැර වෙන කිසිම තැනක වාඩි නොවිය යුතුය. විභාග ශාලාධිපතිගේ විශේෂ අවසරය නොමැතිව තමන්ගේ ස්ථානය වෙනස් නොකළ යුතුයි. තමන්ට නියම නොකරන ලද අසුනක් ගැනීම වංචනික අදහසින් කරන ලද ක්‍රියාවක් වශයෙන් සලකනු ලැබීමට සිදුවේ.

5. විභාග ශාලාව තුළ සම්පූර්ණයෙන් ම නිශ්ශබ්ද ව සිටිය යුතු ය. මොන ම කාරණයක් නිසාවත් විභාග ශාලාව ඇතුළත දී විභාග ශාලාවේ කාර්ය මණ්ඩලයේ කෙනෙකු සමග හැර, විභාග ශාලාව ඇතුළත හෝ පිටත හෝ සිටින කිසිවකු සමග මොනයම් කරුණක් නිසාවත් කතාබස් කිරීම හෝ පණිවුඩ හුවමාරු කර ගැනීම හෝ වෙනත් අන්දමේ ගනුදෙනු කිරීම හෝ සම්පූර්ණයෙන්ම තහනම්ය. යම් කිසි හදිසි වුවමනාවක් සඳහා කිසිවෙකු සමග කතාබස් කිරීමක් අවශ්‍ය වුවහොත් ප්‍රථමයෙන් ඒ සඳහා විභාග ශාලාධිපතින්ගේ අවසරය ලබා ගත යුතු යි.

6. විභාගාපේක්ෂකයෙකුගේ උත්තර පත්‍රය හඳුනාගනු ලබන්නේ ඔහුගේ විභාග අංකයෙන් පමණක් හෙයින් උත්තර පත්‍රවල තමන්ගේ නම නොලිවිය යුතුයි. තමාගේ උත්තර පත්‍රයෙහි අන්‍ය විභාගාපේක්ෂකයෙකුගේ විභාග අංකය ලිවීම වංචනික ක්‍රියාවක් කිරීමට ප්‍රයත්න දැරීමක් ලෙස සලකනු ලැබේ. හඳුනාගත නොහැකි පරිදි විභාග අංකය ලියා ඇති උත්තර පත්‍ර ප්‍රතික්ෂේප කිරීමට ද සිදුවෙනවා ඇත.

7. තමන් වෙත සපයන ලද කඩදාසි හැර තීන්ත පොවන කඩදාසියෙහි හෝ ප්‍රශ්න පත්‍රයෙහි හෝ මේසය මත හෝ වෙන කිසි තැනක හෝ කිසිවක් නොලිවිය යුතුය. මේ නීතිය නොසැලකීම වංචනික චේතනාවකින් යුක්තව ක්‍රියා කිරීමක් ලෙස සැලකිය හැකි වේ.

8. තමන් වෙත සපයන ලද කඩදාසියක් හෝ උත්තර ලියන පොතක් හෝ ඉරාදැමීම හෝ පොඩි කිරීම හෝ නමා දැමීම හෝ අකාමකා දැමීම හෝ නොකළ යුතුය. කටුවැඩ ආදිය සඳහා පාවිච්චි කරන ලද සෑම කඩදාසියක්ම උත්තර පත්‍රයට ඇමිණිය යුතු ය. ඒවා උත්තර පත්‍රයෙහිම කොටසක් විය යුතු ය. එබඳු කටුවැඩ පැහැදිලි ලෙස කපා හැරිය යුතුයි. විභාග ශාලාවේ දී ලියන ලද කිසිම දෙයක් ඉන් පිටත ගෙනයෑම තහනම් ය. එකම ප්‍රශ්නයකට පිළිතුරු දෙතැනක ලියැවී තිබේ නම් අනවශ්‍ය පිළිතුරු පැහැදිලි ලෙස කපා හැරිය යුතුයි. මේ කරුණු පැහැර හැරීම වංචාවක් කිරීමට ප්‍රයත්න දැරීමක් සේ සැළකීමට ඉඩ තිබේ.

9. ගණිත ප්‍රශ්නවල දී ගණන් වරදවා සාදා හෝ ගණනක් කොහෙත්ම නොසාදා හෝ නිවැරදි පිළිතුරු දැක්වීමත් චිත්‍ර කර්මයේ දී තමන්ගේ චිත්‍රය තවත් අපේක්ෂකයෙකුගේ චිත්‍රයට ආකල්ප මාත්‍රයෙන් හෝ ස්වරූපයෙන් හෝ ක්‍රියාකාරිත්වයෙන් හෝ යනාදියකින් සමානව, එසේ නැතිනම් බොහෝ සෙයින්ම කිට්ටුවම තිබීමත්, වංචා සහගත ක්‍රියාවක් සේ සලකනු ලැබීමට හේතු විය හැකිය.

10. විභාගයේ දී උත්තර ලිවීම සඳහා තමන්ට සපයනු ලබන කඩදාසි හෝ වෙනත් ද්‍රව්‍ය විභාග ශාලාවෙන් පිටතට ගෙනයාම තහනම්ය. මේ සියලුම දෑ විභාග කොමසාරිස් සතුය. මේ නීතිය කඩකිරීම වංචනික චේතනාවකින් යුත් ක්‍රියාවක් ලෙස සැලකීමට හේතු විය හැකිය.

11. තමන් වෙත සපයන ලද ලිපිද්‍රව්‍ය හැර වෙනත් පොත්පත්, සටහන් පොත්, සාක්කුවේ පාවිච්චි කරන නෝට් පොත්, ඇක්සයිස් පොත් හා කඩදාසි කොළ හෝ කැබලි ද, තමන්ගේ පාට පෙට්ටි හා පාර්සල් ආදිය ද, පයිල් කවර, කාඩ්බෝඩ් පෑඩ්, නැවූ ප්‍රවෘත්ති පත්‍ර, බ්‍රවුන් පේපර් යනාදිය ද, විභාග ශාලාව තුළ සිටින කිසි විටෙක තමා වෙත හෝ සමීපයෙහි හෝ තබා නොගත යුතුය. මේ නීතිය කඩ කිරීම දඬුවම් ලැබිය හැකි ක්‍රියාවකි.

12. විභාග ශාලාව තුළ කිසිම අපේක්ෂකයෙකු අත කිසිම පොතපතක් හෝ සටහන් පොතක් හෝ සටහන් ලියන කඩදාසියක් හෝ තබා ගැනීම සම්පූර්ණයෙන්ම තහනම් ය. විභාග ශාලාධිපතීන් නියම කළහොත් සෑම අපේක්ෂකයෙක්ම තමන් සන්තකව තිබෙන දෑ මේ මේ යයි සහතික කිරීමට බැඳී සිටී. මේ අවශ්‍යතා කඩකිරීම වංචා සහගත ක්‍රියාවක් කිරීමට යත්න දැරීමක් ලෙස සලකනු ලැබේ.

13. වෙනත් අපේක්ෂකයෙකුගේ උත්තර පත්‍රයකින් හෝ පොතපතකින් හෝ පත්‍රයකින් හෝ සටහන් සහිත කොළයකින් හෝ වෙන කිසිවකින් හෝ ගෙන, හොර උත්තර ලිවීම හෙවත් කොපි කිරීම, හොර උත්තර ලිවීමට යත්න දැරීමද තහනම් ය. තවත් අපේක්ෂකයෙකුගේ උත්තර පත්‍රයක් දෙස බැලීම ද නොකළ යුතුය. වෙන අයදුම්කරුවෙකුට උදව් දීමෙන් ද, වෙන අයදුම්කරුවෙකුගෙන් හෝ පුද්ගලයෙකුගෙන් හෝ උදව් ලබා ගැනීමෙන් ද සම්පූර්ණයෙන්ම වැළකිය යුතුය. උත්තර ලියා සම්පූර්ණ වූ සෑම කඩදාසියක්ම ලියමින් සිටින කඩදාසිය යට තබා ගත යුතුය. ලියන කඩදාසි මේසය මත විසුරුවා නොදැමිය යුතුය.

14. ප්‍රශ්න පත්‍රයකට උත්තර ලියන අතරතුර මොනම කරුණක් නිසාවත් ස්වල්ප වේලාවකටවත් විභාග ශාලාවෙන් පිටවී යාමට කිසිම අපේක්ෂකයෙකු ඉඩදෙනු නොලැබේ. එහෙත් යම්කිසි හදිසි කරුණක් නිසා විභාගාපේක්ෂකයෙකුට ඉන් පිටත යන්නට උවමනා වුවහොත් විභාග ශාලාධිපතිගේ සහකාර නිලධාරියෙකුගේ සුපරීක්ෂාකාරීත්වය යටතේ විභාග ශාලාවෙන් ඔහුට ස්වල්ප වේලාවකට පිටතට යාමට අවසර දෙනු ලැබේ. එසේ පිටතට යාමට පෙරත් නැවත විභාග ශාලාවට ඇතුළු වන විටත් ඔහු සෝදිසියකට භාජනය විය යුතුය.

15. විභාග ශාලාවේ දී පිළිතුරු ලියන විට විභාගය පටන් ගැනීමට පෙර හෝ නියම විභාග අපේක්ෂකයෙකු වෙනුවට ව්‍යාජ අපේක්ෂකයෙකු පෙනී සිටීම දඬුවම් ලැබිය යුතු ක්‍රියාවකි. අනන්‍යතා පත්‍ර වෙනස් කිරීම හෝ බොරු අනන්‍යතා පත්‍ර ඉදිරිපත් කිරීමත්, කෙනෙකුගේ අනන්‍යතා සහතිකය වෙනස් කිරීමත් එබඳු වරදවල් ය. විභාගාපේක්ෂකයන් එවැනි වරදට අසු නොවිය යුතුය.

16. විභාග අපේක්ෂකයෙකු නොවන අයෙක් කිසිම අපේක්ෂකයෙකුට අයථා අන්දමින් වංචා සහගත ලෙස උදව් දීම බරපතල වරදක් ලෙස සලකනු ලැබේ.

විභාග අපේක්ෂකයන් විසින් තමන්ගේ පරෙස්සම සඳහා පහත සඳහන් උපදෙස් අනුව ක්‍රියා කළ යුතු ය. :—

(i) විභාගය පටන් ගන්නා නියමිත වේලාවට සෑහෙන පමණ කලින් විභාග ශාලාවට පැමිණෙන්න. එක් එක් ප්‍රශ්න පත්‍රය පටන් ගැනීමට නියමිත වේලාවට යටත් පිරිසෙයින් විනාඩි 10කට හෝ 15කට කලින් විභාග ශාලාවට පැමිණ සිටීම සෑහේ. විභාග ශාලාව පිහිටා ඇති ස්ථානය හරිහැටි නොදත් විට විභාගය පටන් ගන්නා දිනයට කලින් ඒ ගැන සොයා බලා නියම ස්ථානය හරි හැටි දැන සිටිය යුතුය.

(ii) යම්කිසි විෂයයකට ඇතුළත්වීම ගැන හෝ යම් විෂයයකට පෙනී සිටීමට ඇති සුදුසුකම් ගැන හෝ සැකයක් ඇති වූ විට එම ප්‍රශ්න පත්‍රයට පිළිතුරු සැපයීමට පටන් ගැනීමට පෙර විභාග ශාලාධිපතීන්ට ඒ බැව් සැළකර එම සැකය දුරුකර ගත යුතුයි. එලෙස ක්‍රියා නොකිරීම එම විෂයය හෝ විෂයයන් සම්බන්ධයෙන් තමන්ගේ විභාගාපේක්ෂකත්වය අවලංගු වී යාමට හේතු විය හැකිය.

(iii) විභාගයට පෙනී සිටීමේ දී අපේක්ෂකයන් සෑම විෂයයකටම පෙනී සිටින විට අනන්‍යතා පත්‍ර ඉදිරිපත් කළ යුතුය. අනන්‍යතාවය ඔප්පු කිරීම සඳහා අවශ්‍ය ලියවිලි විභාග ශාලාවේ දී ඉදිරිපත් නොකළහොත් ඔහුගේ විභාගාපේක්ෂකත්වය අවලංගු කිරීමට ඉඩ තිබේ. යම් හෙයකින් ඒ සඳහා අවශ්‍ය ලියවිලි විභාගශාලාවට ගෙන ඒමට අමතක වුවහොත් ඒ බැව් විභාග ශාලාධිපතීන්හට දන්වා විභාගය අවසන් වීමට පෙර එය ඉදිරිපත් කිරීමට මං සළසා ගත යුතුය.

(iv) විභාගය සඳහා සාමාන්‍යයෙන් සම්මත වර්ගයකට අයත් ලිපිද්‍රව්‍ය (එනම් ලියන කඩදාසි, තීන්ත පොවන කඩදාසි, ලැජර් කඩදාසි, සාරාංශ ලියන කඩදාසි) ආදිය සපයනු ලැබේ. සාමාන්‍යයෙන් කාටත් බෙදා දෙන වර්ගයකට වෙනස් වූ හෝ අමුතු මෝස්තරයක ලිපි ද්‍රව්‍ය ඔබට ලැබුණහොත් ඒ බව නොපමාව විභාගශාලාධිපතිට දැන්විය යුතුයි. විභාග ශාලාවේ දී ඔබට දෙනු ලබන කඩදාසි හැර වෙන මොනම කඩදාසියක්වත් ප්‍රශ්නවලට උත්තර ලිවීම සඳහා පාවිච්චි නොකළ යුතුයි. ඉතිරි වන කඩදාසි සහ වෙනත් ද්‍රව්‍ය අපිරිසිදු නොකර නැවත ප්‍රයෝජනයට ගත හැකි වන සේ ඔබගේ ලියන මේසය මත තබන්න. ඔබට ලඝුගණක චක්‍ර සපයන ලද්දේ නම් ඒවා පරිස්සමින් පාවිච්චි කොට ඔබේ ලියන මේසය මත තිබෙන්නට හැරිය යුතුය.

(v) විභාගාපේක්ෂකයන් තම තමන්ගේ පෑන්, පැන්සල්, තීන්ත කූඩු, මකන, රෙදි කෑලි, අඩිකෝදු, ජ්‍යාමිතික උපකරණ, පාට පැන්සල් පෙට්ටි, පාට හුණු පෙට්ටි යනාදිය රැගෙන ආ යුතුයි.

(vi) තමන් පාවිච්චි කරන සෑම කඩදාසියකම පිළිතුරු ලිවීමට පටන් ගැනීමේ දී නොපමාව තමන්ගේ විභාග අංකය හා විභාගයේ නමත් පැහැදිලි ලෙස ලියන්න. කඩදාසියේ දෙපැත්තේම පැහැදිලිව ද පිරිසිදුව ද උත්තර ලියන්න. ප්‍රශ්නයක කොටසකට උත්තර ලිවීමෙන් පසු අනික් කොටස පටන් ගැනීමට පෙර එක රූලක්වත් හිස්ව තිබිය යුතුයි. සම්පූර්ණ ප්‍රශ්නයකට උත්තර ලිවීමෙන් පසු රූලක් හෝ රූල් කීපයක් හෝ හිස්ව තබන්න. ලියන සෑම දෙයක්ම එක ගොඩේ තෝරා බේරා ගන්නට නොහැකි ලෙස නොලිවිය යුතුයි.

(vii) උත්තර ලියන කඩදාසියෙහි වම් පැත්තේ තීරය වෙන්කර ඇත්තේ ප්‍රශ්නවල අංක ලිවීම සඳහා ය. දකුණු පැත්තේ තීරය වෙන්කර ඇත්තේ පරීක්ෂකවරයාගේ ප්‍රයෝජනය සඳහා බැවින් එහි කිසිවක් නොලිවිය යුතුයි. තමන් විසින් උත්තර ලියන ලද ප්‍රශ්නවල අංක වරදවා යෙදීම ව්‍යාකූලත්වයට හේතුවන බැවින් ප්‍රශ්න අංක ඉතා පරෙස්සමින් නිවැරදි ලෙස යෙදිය යුතුය.

(viii) අනිවාර්ය ප්‍රශ්න ද, තෝරා ගත යුතු අන් ප්‍රශ්න ද සම්බන්ධව ප්‍රශ්න පත්‍රයේ මුලින්ම සඳහන් කොට ඇති උපදෙස් ඉතා පරෙස්සමින් කියවා බැලිය යුතුයි. මෙය නොසලකා හැරීමෙන් බොහෝ විට පාඩු සිදුවිය හැකිය.

(ix) ගණිත ප්‍රශ්නවලට උත්තර සපයන විට ගැන බැලීම සහ කටුවැඩ ඒ ඒ ගණන් සෑදීමේ කොටසක් වශයෙන් අනුක්‍රමයෙන් විස්තර ලෙස දැක්විය යුතුය. අවශ්‍ය තැන්වල අඳිනු ලබන රූප සටහන් හා චිත්‍ර ආදිය නිවැරදිව ද සෑහෙන පමණ විශාලව ද තිබිය යුතුයි. පිටු කීපයකට යන දිග පිළිතුරුවල දී එක පිටුවක අඳින ලද රූප සටහන් සම්බන්ධයෙන් ඊළඟ පිටුවලදීත් සිත් යොමුකර විය යුතු අවස්ථාවල දී ඒ රූප සටහන් නැවතත් ඇඳ පෙන්වීම යෝග්‍ය වේ.

(x) එක් එක් ප්‍රශ්න පත්‍රයට පිළිතුරු සපයා අවසන් වූ විට උත්තර ලියන ලද කඩදාසි සියල්ලම ප්‍රශ්නවලට උත්තර ලියූ පිළිවෙල අනුව එකතුකොට වම් පැත්තේ ඉහළ කෙළවරේ තමන්ට සපයන ලද නූල් කැබැල්ලෙන් නොගැලවී යන පරිදි එකට තබා අමුණා ගැටගසන්න. දකුණු පැත්තේ උඩ කෙළවරවල් එකට තබා ගැට නොගසන්න.

(xi) ඔබගේ උත්තර පත්‍රය විභාගශාලාධිපතීන්ට හෝ ඔවුන්ගේ සහකාර මහතකුට හෝ සියතින්ම භාරදිය යුතුය. නැතහොත් ඒවා එකතු කරන තුරු ඔබේ අසුනේම වාඩි වී සිටිය යුතුය. එසේ නොකිරීම ඇතැම් විට ඔබගේ උත්තර පත්‍රය නැති වී යාමට ද ඔබ යම් විෂයයකට ඉදිරිපත් නොවූවකු සේ සලකනු ලැබීමට ද හේතු විය හැකිය. මොනම කරුණක් නිසාවත් ඔබගේ උත්තර පත්‍රය විභාග ශාලාවේ සේවය කරන පියුන් කෙනෙකුට හෝ වෙනයම් සේවකයෙකුට හෝ බාර නොදිය යුතුය.

(xii) යම්කිසි කරුණක් නිසා විභාග ශාලාධිපතීන්ට හෝ ඔහුගේ සහකාර මහතෙකුට හෝ කථා කිරීමට අවශ්‍ය වූ විට ද, කඩදාසි ආදිය අවශ්‍ය වූ විට ද තම ආසනයෙන් නොනැගිට අත පමණක් එසවිය යුතුය.

**විභාග කොමසාරිස් ජනරාල්.**

පැලවත්ත,
බත්තරමුල්ල,
ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුවේ දී ය.

# තනතුරු - ඇබෑර්තු

## නාගරික සංවර්ධන හා නිවාස අමාත්‍යාංශය

### වෙරළ සංරක්ෂණ සහ වෙරළ සම්පත් කළමනාකරණ දෙපාර්තමේන්තුව

**දෙපාර්තමේන්තුගත ජ්‍යෙෂ්ඨ විධායක සේවා නිලධාරි සේවා ගණයේ අතිරේක අධ්‍යක්ෂ ජනරාල් (සංවර්ධන) තනතුරට බඳවා ගැනීමේ යෝග්‍යතා ඇගයීමේ සම්මුඛ පරීක්ෂණය - 2022**

වෙරළ සංරක්ෂණ හා වෙරළ සම්පත් කළමනාකරණ දෙපාර්තමේන්තුවේ, ජ්‍යෙෂ්ඨ විධායක සේවා නිලධාරි සේවා ගණයේ අතිරේක අධ්‍යක්ෂ ජනරාල් (සංවර්ධන) තනතුර සඳහා බඳවා ගැනීමේ යෝග්‍යතා ඇගයීමේ සම්මුඛ පරීක්ෂණය රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් 2023 ජනවාරි මාසයේ දී කොළඹ දී පමණක් පවත්වනු ලැබේ. සම්මුඛ පරීක්ෂණය පවත්වන දිනය යථා කාලයේ දී දැනුම් දෙනු ලැබේ. මෙකී සම්මුඛ පරීක්ෂණය කල් දැමීම හෝ අවලංගු කිරීමේ අයිතිය රාජ්‍ය සේවා කොමිෂන් සභා ලේකම් සතුවේ. උසස් කිරීමේ දිනය ලෙස සලකනු ලබන්නේ සම්මුඛ පරීක්ෂණය පවත්වනු ලබන දිනය වේ.

මෙහි පහත සුදුසුකම් සතුව ඇති ස්ත්‍රී/පුරුෂ දෙපක්ෂයන් ම මෙම තනතුරු සඳහා ඉල්ලුම්පත් කැඳවනු ලැබේ.

2. **යෝග්‍යතාවය :**

(i) සෑම අයඳුම්කරුවෙකුම ඔහු/ඇය
- (අ) ශ්‍රී ලංකාවේ පුරවැසියෙකු විය යුතුය.
- (ආ) විශිෂ්ඨ චරිතයකින් යුක්ත විය යුතුය.
- (ඇ) උපරිම වයස් සීමාව අදළ නොවේ.
- (ඈ) මෙම තනතුරට උසස් කිරීම සඳහා සුදුසුකම් ලබන දිනට පූර්වාසන්න වසර පහ (05) තුළ දනට දරන තනතුරේ වාර්ෂික කාර්ය සාධනය සතුටුදයක හෝ ඉහළ මට්ටමක පැවතිය යුතුය.
- (ඉ) රාජ්‍ය සේවා කොමිෂන් සභා චක්‍රලේඛ අංක 01/2020 හා සඳහන් විධිවිධානයන්ට අනුකූලව විනයානුකූලව දඬුවමක් ලබා නොතිබිය යුතුය. (සම්මුඛ පරීක්ෂණ දිනය දක්වා කාල සීමාව ද ඇතුළත් විය යුතුයි)
- (ඊ) සේවයට බඳවා ගැනීම සඳහා වන යෝග්‍යතා ඇගයීමේ සම්මුඛ පරීක්ෂණයට පෙනී සිටීම සඳහා අවශ්‍ය සුදුසුකම් සපුරා ඇති බවට පිළිගනු ලබන්නේ නිලධාරියා සියලු සුදුසුකම් මෙහි 6(ii) හා 6(iii) හි සඳහන් අයඳුම්පත් එවිය යුතු අවසාන දිනට සෑම ආකාරයකින් ම සම්පූර්ණ කර තිබේ නම් පමණි.

(ii) අධ්‍යාපන සුදුසුකම් :- විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගෙන ඇති විශ්ව විද්‍යාලයකින් හෝ උපාධි ප්‍රදනය කිරීමේ ආයතනයක් වශයෙන් විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගෙන ඇති ආයතනයකින් හෝ පිරිනමනු ලබන, විෂය ක්ෂේත්‍රයට අදළ පශ්චාත් උපාධියක් ලබා ගෙන තිබීම.

(iii) පළපුරුද්ද :-වෙරළ සංරක්ෂණ හා වෙරළ සම්පත් කළමනාකරණ දෙපාර්තමේන්තුවේ, දෙපාර්තමේන්තුගත විධායක නිලධාරි සේවා ගණයේ ( SL- 01) I ශ්‍රේණියේ අධ්‍යක්ෂ (වෙරළ සම්පත් කළමනාකරණ) තනතුරෙ හි වසර පහක (05) සක්‍රීය හා සතුටුදයක සේවා කාලයක් සම්පූර්ණ කළ නිලධාරියකු වීම

හෝ

ශ්‍රී ලංකා පරිපාලන සේවයේ I ශ්‍රේණියේ තනතුරක අවම වශයෙන් වසර පහක (05) සක්‍රීය හා සතුටුදයක සේවා කාලයක් සම්පූර්ණ කර තිබීම.

හා

ඉහත සුදුසුකම් සහිතව, උසස් කිරීම සඳහා සුදුසුකම් ලබන සේවා ගණයේ / තනතුරුවලට අදළ විධායක ශ්‍රේණියේ වසර 18කට නොඅඩු සක්‍රීය හා සතුටුදයක සේවා කාලයක් සම්පූර්ණ කර තිබීම.

3. **සේවා කොන්දේසි :**

(i) වැටුප - මෙම තනතුරට අයත් ඒකාබද්ධ වැටුප් පරිමාණය පහත දැක්වේ. :-
රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 03/2016 අනුව වැටුප් ක්‍රමය SL - 3 දරන වැටුප් කාණ්ඩයේ, රු. 88,000 - 12 x 2700 - රු. 120,400 වේ.

(ii) මෙම තනතුර ස්ථිරය. විශ්‍රාම වැටුප් සහිතය. (විශ්‍රාම වැටුප් ක්‍රමය පිළිබඳ රජය විසින් ඉදිරියේ දී ගනු ලබන ප්‍රතිපත්තිමය තීරණයන්ට යටත් විය යුතුය.)

(iii) තෝරාගනු ලබන නිලධාරීන් දිවයිනේ ඕනෑම ප්‍රදේශයක සේවය කිරීමේ කොන්දේසියට යටත් වේ.

(iv) පත්වීම එක් අවුරුදු වැඩ බැලීමේ කාලයකට යටත් වේ.

**4. යෝග්‍යතා ඇගයීමේ සම්මුඛ පරීක්ෂණය**

ලකුණු ලබාදීමේ පිළිවෙල

| ලකුණු ලබා දෙනු ලබන ප්‍රධාන ශීර්ෂ | | උපරිම ලකුණු ප්‍රමාණය |
|---|---|---|
| 1. *අතිරේක සේවා පළපුරුද්ද*<br>➢ශ්‍රී ලංකා පරිපාලන සේවයේ I ශ්‍රේණියේ තනතුරක අවම වශයෙන් වසර 05ක හෝ වෙරළ සංරක්ෂණ වෙරළ සම්පත් කළමනාකරණ දෙපාර්තමේන්තුවේ විධායක නිලධාරී සේවා ගණයේ (SL - 01) I ශ්‍රේණියේ අධ්‍යක්ෂ (වෙරළ සම්පත් කළමනාකරණ) තනතුරේ හි වසර 05ක සක්‍රීය හා සතුටුදායක සේවා කාලයට අමතරව සම්පූර්ණ කර ඇති සක්‍රීය හා සතුටුදායක සේවා කාලයන් සඳහා රාජ්‍ය සේවා කොමිෂන් සභා චක්‍රලේඛ 1/2019 අනුව, වැඩිම අමතර සේවා කාලයක් සහිත අයදුම්කරුට උපරිම ලකුණු ප්‍රමාණය ද සෙසු අයදුම්කරුවන්ට ඊට සමානුපාතික වන පරිදි ද ලකුණු ලබා දේ.<br>**(මාස 3කට අඩු කාලයක් සඳහා ලකුණු ලබාදෙනු නොලැබේ.)** | | 40 |
| 2. *අතිරේක අධ්‍යාපන හා වෘත්තීය සුදුසුකම්*<br>(a) රැකියා ක්ෂේත්‍රයට අදාළ පාඨමාලා<br>● ඩිප්ලෝමා පාඨමාලාව (කාලය අවුරුදු 1කට වැඩි) ලකුණු 10<br>● ඩිප්ලෝමා පාඨමාලාව (කාලය මාස 6 - මාස 12 අතර) ලකුණු 08<br>● සහතික පත්‍ර පාඨමාලාව (කාලය මාස 3 - මාස 6 අතර) ලකුණු 04<br>● සහතික පත්‍ර පාඨමාලාව (කාලය මාස 3කට අඩු) ලකුණු 02<br>*උපරිම සුදුසුකම සපුරන ලද එක් පාඨමාලාවක් සඳහා පමණක් ලකුණු ලබා දීම සිදු කෙරේ.<br>*බඳවා ගැනීමේ දී, වෙනත් උසස් වීමක දී හෝ කාර්යක්ෂම කඩඉම සඳහා සැලකූ සුදුසුකම් සඳහා ලකුණු ලබා නොදේ. | 10 | 15 |
| (b) දේශීය හෝ විදේශීය ධාරිතා ප්‍රවර්ධන පුහුණු පාඨමාලා/වැඩසටහන් සඳහා<br>● මාස 01 හෝ ඊට වැඩි ලකුණු 05<br>● සති 01 - මාස 01 අතර පුහුණුව ලකුණු 02<br>● සති 01කට අඩු පුහුණුව ලකුණු 01<br>***උපරිම ලකුණු සීමාවට යටත්ව පුහුණු පාඨමාලා/වැඩසටහන් එකකට වැඩි ගණනකට ලකුණු ලබා දේ.** | 05 | |
| 3. *ක්ෂේත්‍රය සඳහා දායකත්වය*<br>වෙරළ සංරක්ෂණ හා වෙරළ සම්පත් කළමනාකරණ වැඩසටහන් වෙනුවෙන් හා ඒ සම්බන්ධ ව්‍යාපෘති වෙනුවෙන් දක්වන ලද දායකත්වය එක් වැඩසටහනකට හෝ ව්‍යාපෘතියකට ලකුණු 05 බැගින් | | 20 |
| 4. *පරිගණක හා ඉංග්‍රීසි භාෂා ප්‍රවීණතාවය*<br>(a) ඉංග්‍රීසි පාඨමාලා<br>● ඩිප්ලෝමා පාඨමාලා (කාලය මාස 6ට වැඩි) ලකුණු 10<br>● සහතික පත්‍ර පාඨමාලා (කාලය මාස 3 - මාස 6 අතර) ලකුණු 05<br>● සහතික පත්‍ර පාඨමාලාව හෝ කෙටි කාලීන පුහුණු (කාලය මාස 3කට අඩු) ලකුණු 03<br>* උපරිම සුදුසුකම සපුරන ලද එක් පාඨමාලාවක් සඳහා පමණක් ලකුණු ලබා දීම සිදු කෙරේ. | 10 | 20 |
| (b) පරිගණක තොරතුරු පාඨමාලා<br>● ඩිප්ලෝමා පාඨමාලා (කාලය මාස 6ට වැඩි) ලකුණු 10<br>● සහතික පත්‍ර පාඨමාලා (කාලය මාස 3 - මාස 6 අතර) ලකුණු 05<br>● සහතික පත්‍ර පාඨමාලාව හෝ කෙටි කාලීන පුහුණු (කාලය මාස 3කට අඩු) ලකුණු 03<br>*** උපරිම සුදුසුකම සපුරන ලද එක් පාඨමාලාවක් සඳහා පමණක් ලකුණු ලබා දීම සිදු කෙරේ.** | 10 | |
| 5. ආකල්ප හා පෞරුෂත්වය ලකුණු 01 | | 05 |
| එකතුව | | 100 |

යෝග්‍යතා ඇගයීමේ සම්මුඛ පරීක්ෂණය සඳහා ලබාගන්නා ලකුණුවල කුසලතා අනුපිළිවෙල අනුව රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් සුදුසුකම් සහිත අයදුම්කරුවන් අතරින් තනතුරට බඳවා ගැනේ.

5. **ප්‍රතිඵල නිකුත් කිරීම** : යෝග්‍යතා ඇගයීමේ සම්මුඛ පරීක්ෂණය සඳහා ලබාගන්නා ලකුණුවල කුසලතා අනුපිළිවෙල අනුව සකස් කළ ප්‍රතිඵල ලේඛණය රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් පෙනී සිටි සියලුම අයදුම්කරුවන් වෙත තැපැල් මගින් හෝ නිල වෙබ් අඩවිය මගින් හෝ දනුම් දෙනු ලැබේ.

6. **ඉල්ලුම් කිරීමේ පිළිවෙල** :

i. ආදර්ශ අයදුම්පත - මෙම නිවේදනය අවසානයේ පළ කර ඇත. අයදුම්කරුවන් විසින් මෙකී ආදර්ශ අයදුම්පත තමන්ගේ ම අත් අකුරෙන් සම්පූර්ණ කළ යුතුය. අයදුම්පතේ සෑම වගන්තියක් ම උපදෙස් දී ඇති පරිදි ම අයදුම්කරු විසින් පිරවිය යුතු අතර, තමන් වෙනුවෙන් අදාළ නොවන වගන්ති වෙතොත් ඒවා ''අදාළ නොවේ'' යනුවෙන් සටහන් කළ යුතුය. අයදුම්පතේ හිස් තීරු තැබීමෙන් එය ප්‍රතික්ෂේප වීමට ඉඩ ඇති බව තරයේ ම සිහි තබාගත යුතුය. (ආදර්ශ අයදුම්පත්‍රයේ අංක 01 සිට 08 තෙක් පළමු වන පිටුවේ ද, 09 සිට 15 තෙක් දෙවන පිටුවේ ද, 16 හා 17 තුන්වන පිටුවේ ද වන සේ A4 ප්‍රමාණයේ කඩදාසිවල සකස් කරන්න) අයදුම්පත පිළියෙල කිරීමේ දී සම්මුඛ පරීක්ෂණයේ නම සිංහල ඉල්ලුම්පත්‍රවල සිංහලට අමතරව ඉංග්‍රීසියෙන් ද, දෙමළ ඉල්ලුම් පත්‍රවල දෙමළට අමතරව ඉංග්‍රීසියෙන් ද යෙදිය යුතුය. සම්පූර්ණ කරන ලද අයදුම්පත්‍රයේ පිටපතක් ළඟ තබා ගැනීම ප්‍රයෝජනවත් වනු ඇත. නිවේදනයේ ඇතුළත් ආදර්ශ අයදුම්පත්‍රයට අනුකූල නොවන හා අසම්පූර්ණ අයදුම්පත්‍ර දනුම් දීමකින් තොරව ප්‍රතික්ෂේප කරන බැවින්, අයදුම්පත්‍රය යොමු කිරීමට ප්‍රථම එය විභාග නිවේදනයේ සඳහන් ආදර්ශ අයදුම්පත්‍රයට අනුකූලද යන්න හා සියලු තොරතුරු ඇතුළත් කොට ඇත්ද යන්න පිළිබඳවත් නැවත විමසිලිමත් වන්න.

ii. අයදුම්පත් **2023.01.02** වැනි දිනට හෝ ඊට ප්‍රථමයෙන් අධ්‍යක්ෂ ජනරාල්, වෙරළ සංරක්ෂණ හා වෙරළ සම්පත් කළමනාකරණ දෙපාර්තමේන්තුව, 4 වන මහළ, නව මහ ලේකම් කාර්යාලය, මාළිගාවත්ත, කොළඹ 10.'' ලිපිනය වෙත ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතුය. එම දිනට පසුව ලැබෙන අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ. අයදුම්පත්‍රය බහා එවනු ලබන කවරයේ වම් පස ඉහළ කෙළවරේ සම්මුඛ පරීක්ෂණයේ නම පැහැදිලිව සඳහන් කළ යුතුය.

iii. ආණ්ඩුවේ දෙපාර්තමේන්තු/මණ්ඩල/සංස්ථා ආදියෙ හි දනට සේවයෙ හි යෙදී සිටින අයදුම්කරුවන් තමන්ගේ අයදුම්පත් තමන් සේවය කරන දෙපාර්තමේන්තුවේ හෝ ආයතනයේ ප්‍රධානියා මගින් ඉදිරිපත් කළ යුතුය. **2023.01.02** දින හෝ ඊට ප්‍රථම වෙරළ සංරක්ෂණ හා වෙරළ සම්පත් කළමනාකරණ අධ්‍යක්ෂ ජනරාල් වෙත ලැබෙන පරිදි යවන ලෙස ඉල්ලීමක් ද සමඟ ස්වකීය අයදුම්පත් තමන්ගේ දෙපාර්තමේන්තුවල ප්‍රධානීන් වෙත කල් ඇතිව ඉදිරිපත් කරන ලෙස අයදුම්කරුවන්ගෙන් ඉල්ලා සිටිනු ලැබේ. වෙරළ සංරක්ෂණ හා වෙරළ සම්පත් කළමනාකරණ දෙපාර්තමේන්තුවේ වෙනත් නිලධාරියකුගේ පෞද්ගලික නමට අයදුම්පත් නොඑවිය යුතුය. දෙපාර්තමේන්තුව මගින් ඉදිරිපත් කරන අයදුම්පත් වුව ද නියමිත දිනට පසුව ලැබුණහොත් ප්‍රතික්ෂේප කරනු ලැබේ.

iv. **අත්සන සහතික කිරීම** : දනට රජයේ සේවයේ යෙදී සිටින අයදුම්කරුවකුගේ අත්සන සහතික කළ යුත්තේ අදාළ දෙපාර්තමේන්තු ප්‍රධානියා හෝ ඔහු වෙනුවෙන් එසේ කිරීමට බලයලත් නිළධාරියකු විසිනි. අනෙකුත් අයදුම්කරුවන්ගේ අත්සන්, ඒවා සහතික කිරීමට බලයලත් කෙනෙකු විසින් සහතික කළ යුතුය. එනම්, සාමදාන විනිශ්චයකාරවරයෙකු, දිවුරුම් කොමසාරිස්වරයෙකු, නීතිඥයකු, නොතාරිස් කෙනෙකු, රජයේ පාසලක විදුහල්පතිවරයෙකු, නාවික, ගුවන් හෝ යුධ හමුදවක කොමිෂන් ලත් නිලධාරියකු වාර්ෂිකව රුපියල් 240,360 ක් හෝ ඊට වැඩි වැටුපක් ලබන රජයේ ස්ථිර නිලධාරියකු, බෞද්ධ විහාරයක විහාරාධිපති හෝ නායක ස්වාමීන් වහන්සේ කෙනෙකු, අන්‍ය ආගමික පූජ්‍ය ස්ථානයක් භාර හෝ පූජ්‍ය පක්ෂයේ සැළකිය යුතු තත්වයක් දරන කෙනෙකු විය යුතුය.

07. **ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණය සඳහා කැඳවීම** : දිනයක් නියම කර ගැනීමෙන් අනතුරුව සියලුම අයදුම්කරුවන් වෙත ලිපියක් මගින් දනුම් දීමට කටයුතු කරනු ලැබේ.

**සටහන** : ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණය සඳහා කැඳවීම අයදුම්කරුවකු ඒ සඳහා සියළු සුදුසුකම් සපුරා ඇති බවට පිළිගැනීමක් ලෙස නොසැලකේ.

08. **අනන්‍යතාවය** : අයදුම්කරුවන් ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණය සඳහා ඉදිරිපත් වීමේ දී සම්මුඛ පරීක්ෂණ මණ්ඩලය සෑහීමකට පත්වන පරිදි ස්වකීය අනන්‍යතාව ඔප්පු කළ යුතුය. ඒ සඳහා පහත දක්වෙන ලියවිලි අතුරින් කුමක් වුවත් භාරගනු ලැබේ.

(අ) පුද්ගලයින් ලියාපදිංචි කිරීමේ දෙපාර්තමේන්තුව විසින් නිකුත් කරන ලද ජාතික හැඳුනුම්පත
(ආ) වලංගු විදේශ ගමන් බලපත්‍රය (පාස්පෝට් බලපත්‍රය)

ඉහත සඳහන් ලියවිල්ලක් ඉදිරිපත් කළ නොහැකි අයදුම්කරුවන්හට ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයට පෙනී සිටීමට අවසර දෙනු නොලැබේ.

09. **සුදුසුකම් පිළිබඳ ලියවිලි :**

i. අයදුම්පත සමග ව්‍යුහගත සම්මුඛ පරීක්‍ෂණයට අදළ ලිපි හා සහතික පත්‍රවල පිටපත් අමුණා එවිය යුතුය. එසේම, නියම කොට ඇති පරිදි, අවශ්‍ය සියලුම විස්තර අයදුම්පතෙ හි සඳහන් කළ යුතුය. මෙසේ අවශ්‍ය වන කරුණුවලින් සම්පූර්ණ නොවන අයදුම්පතක් වෙතොත් එය ප්‍රතික්ෂේප කරනු ලැබේ.

ii. සම්මුඛ පරීක්ෂණයට කැඳවීමට සුදුසුකම් ලබන අයදුම්කරුවන් ලියවිලිවලින් සාක්ෂි ඉදිරිපත් කොට ස්වකීය යෝග්‍යතාවය ඔප්පු කළ යුතුය.

iii. පහත දැක්වෙන ලියවිලිවල මුල් පිටපතක් අවශ්‍ය වේ.

(අ) යහපත් චරිතය පිළිබඳ වගකිය යුතු පුද්ගලයකු විසින් අත්සන් කරන ලද සහතිකයක්,
**සටහන :** එම සහතිකය සාමදාන විනිශ්චයකාරවරයකු, නීතිඥවරයෙකු, පදිංචි කොට්ඨාසයේ ප්‍රාදේශීය ලේකම්වරයාගේ හෝ වාර්ෂිකව රුපියල් 240,360 ක් හෝ ඊට වැඩි වැටුපක් ලබන රජයේ ස්ථිර නිළධාරියෙකු, සාමාන්‍යයෙන් ප්‍රසිද්ධියක් දරන කෙලින් ම දන්වා තොරතුරු ලබාගත හැකි තැනැත්තකු යන මොවුන්ගෙන් කවරකුගෙන් වුවද ලබා ගත හැකි වේ. සහතිකය දෙන තැනැත්තාගේ පදවි නාමය, නම සහ ලිපිනය ද එහි පැහැදිලි ලෙස සඳහන්ව තිබිය යුතුය. (රාජ්‍ය සේවයේ ස්ථිර තනතුරක් උසුලන අයදුම්කරුවන් විසින් යහපත් චරිතය පිළිබඳ සහතිකය ඉදිරිපත් කිරීම අවශ්‍ය නොවේ.)

(ආ) අයදුම්කරුවන්ගේ උප්පැන්නය ලියාපදිංචි කිරීමේ සටහනෙ හි සහතික කළ පිටපතක් හෝ (උප්පැන්න ලියාපදිංචි නොකළ අයදුම්කරුවන් සම්බන්ධයෙන් වූ විට) රෙජිස්ට්‍රාර් ජනරාල් විසින් නිකුත් කරන ලද වයස පිළිබඳ විශේෂ සහතිකයක්.

**සටහන් :**

i. පාඨශාලාවල භාවිතය සඳහා හෝ අධ්‍යාපනික කටයුතු උදෙසා නිකුත් කරන ලද විශේෂ උප්පැන්න සහතික හෝ උප්පැන්න ලියාපදිංචි කිරීමේ සටහනෙන් උපුටා ගන්නා ලද සහතික පත්‍ර උද්ධෘත භාරගනු නොලැබේ.

ii. උප්පැන්න සහතික වෙනුවට දිවුරුම් පෙත්සම් හෝ බෞතිස්ම සහතික භාරගනු නොලැබේ. උප්පැන්න සහතිකයෙ හි දැක්වෙන නම/නම් හා අයදුම්කරු/අයදුම්කාරිය සාමාන්‍යයෙන් භාවිතා කරන එසේම ඔහු/ඇය විභාගයේ දී පෙනී සිටින නම/නම් හා අතර වෙනසක් වේනම් උචිත පරිදි උප්පැන්න හා මරණ ලියාපදිංචි කිරීමේ ආඥාපනතේ (110 වැනි පරිච්ඡේදයේ) අංක 27 හා 28 දරන නියමයන් අනුව ස්වකීය උප්පැන්නයේ දැක්වෙන නම/නම් වෙනස් කරවා ගැනීමට වහාම කටයුතු කළ යුතුය.

iii. ශ්‍රී ලංකාවේ පුරවැසියෙකු වශයෙන් ලියාපදිංචි වීමේ සහතිකයක් හෝ පරම්පරාවෙන් හිමි වූ පුරවැසි බවක් ඇති බැව් රජය මඟින් පිළිගත් බව දැක්වෙන ලිපියක් (උචිත පරිදි)

iv. අධ්‍යාපන සුදුසුකම් පිළිබඳ මුල් සහතිකයක් හෝ එසේ සහතිකයක් නිකුත් කොට නැත්නම් ඊට අදාළ වූ වෙනත් රාජකාරි ලියවිල්ලක් එනම්, අයදුම්කරු උපාධි විභාගය සමත් බවට විශ්වවිද්‍යාලයක ලේඛකාධිකාරී විසින් නිකුත් කරන ලද නිල ලියවිල්ලක්,

v. ඉල්ලුම් පත්‍ර ඉදිරිපත් කරන ලද අවස්ථාවේ දී අවශ්‍ය සියලුම ලියකියවිලි සූදානම් කොට තබා ගන්නා ලෙස අයදුම්කරුවන්ට අවවාද කරනු ලැබේ. ඉල්ලා සිටි විටෙක අවශ්‍ය ලියකියවිලි ඉදිරිපත් කිරීමට අපොහොසත් වන හෝ ඒවා ඉදිරිපත් කිරීමට ප්‍රමාද කරන අයදුම්කරුවකු වෙතොත් ඔහු මෙම තනතුරට පත් කිරීමට නුසුදුස්සකු කරනු ලැබේ.

10. සාවද්‍ය තොරතුරු සැපයීම - මෙම ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයේ රෙගුලාසි අනුව කිසියම් අයදුම්කරුවකු ඊට පෙනී සිටීමට සුදුසුකම් නැති බව පෙනී ගියහොත් ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයට පෙරාතුව හෝ එය පවත්වත් දී හෝ ඉන්පසුව හෝ කවර අවස්ථාවක දී වුව ද, ඔහුගේ අපේක්ෂකත්වය අවලංගු කරනු ලැබිය හැකිය. අයදුම්කරුවකු විසින් දැන දැනම සාවද්‍ය තොරතුරක් සපයා ඇති බවත්, හෝ කිසියම් වැදගත් කරුණක් දැන දැනම වසන් කළ බවක් හෝ පෙනී ගියහොත් හෝ ඔහු/ඇය මෙම ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයට පෙනී සිටීම නුසුදුස්සකුව සිටි බව ඔහුගේ/ඇයගේ සේවා කාලය තුළ කිසියම් අවස්ථාවක දී ඔප්පු වුවහොත්, හෝ එයම ඔහු/ඇය වහාම සේවයෙන් පහ කිරීමට හේතු වනු ඇත. මෙම නිවේදනයේ සඳහන් අවශ්‍යතා නියමිත අයුරින් සපයා නොමැති අයදුම්කරුවන්ගේ අපේක්ෂකත්වය අවලංගු කරනු ලැබේ.

11. මෙම රෙගුලාසිවලින් විස්තර නොකරන ලද අදාළ වූ වෙනයම් කරුණක් වේ නම් එය රාජ්‍ය සේවා කොමිෂන් සභා ලේකම්ගේ අභිමතය පරිදි තීරණය කරනු ඇත.

12. මෙහි සිංහල, දෙමළ හා ඉංග්‍රීසි මාධ්‍ය නිවේදනය අතර කිසියම් අනනුකූලතාවක් පැන නැගුන හොත්, එවැනි විටකදී සිංහල මාධ්‍ය නිවේදනය බලපැවැත්වේ.

ලේකම්,
රාජ්‍ය සේවා කොමිෂන් සභාව.

ආදර්ශ අයදුම් පත්‍රය

නාගරික සංවර්ධන හා නිවාස අමාත්‍යාංශය

වෙරළ සංරක්ෂණ සහ වෙරළ සම්පත් කළමනාකරණ දෙපාර්තමේන්තුවේ දෙපාර්තමේන්තුගත ජ්‍යෙෂ්ඨ විධායක සේවා ශ්‍රේණියේ අතිරේක අධ්‍යක්ෂ ජනරාල් (සංවර්ධන) තනතුරට බඳවා ගැනීමේ යෝග්‍යතා ඇගයීමේ සම්මුඛ පරීක්ෂණය - 2022

කාර්යාලයීය ප්‍රයෝජනය සඳහා ☐

01. නම

1.1 මුලකුරු අගට යොදා මුලකුරු සමග නම :————.
(ඉංග්‍රීසි කැපිටල් අකුරින් උදා : SILVA A. B.)

1.2 මුලකුරුවලින් හැඳින්වෙන නම් :————.
(ඉංග්‍රීසි කැපිටල් අකුරින්)

1.3 සම්පූර්ණ නම (සිංහලෙන්) :————.

2. 2.1 පුද්ගලික ලිපිනය :————.
2.2 කාර්යාලයීය ලිපිනය :————.
2.3 ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයේ කැඳවීම් ලිපිය යැවිය යුතු ලිපිනය :————.
2.4 දුරකථන අංකය :————.

03. 3.1 උපන් දිනය : වර්ෂය ☐☐☐☐ මාසය ☐☐ දිනය ☐☐

(උප්පැන්න සහතිකයේ පිටපතක් අමුණා ඇත.)

3.2 2023.01.02 දිනට වයස : අවු :————. මාස :————. දින :————.

3.3 ජාතික හැඳුනුම්පත් අංකය : ☐☐☐☐☐☐☐☐☐☐☐☐

04. 4.1 ස්ත්‍රී/පුරුෂ භාවය
ස්ත්‍රී ☐
පුරුෂ ☐

4.2 විවාහක/අවිවාහක/වැන්දඹු ද යන වග :
විවාහක ☐
අවිවාහක ☐
වැන්දඹු ☐

05. දෙපාර්තමේන්තුගත විධායක නිලධාරී සේවා ගණයේ/ශ්‍රී ලංකා පරිපාලන සේවයේ තනතුරකට මුලින් පත් කළ දිනය :————.

06. දෙපාර්තමේන්තුගත විධායක නිලධාරී සේවා ගණයේ/ශ්‍රී ලංකා පරිපාලන සේවයේ I ශ්‍රේණියට උසස් වීම් ලද දිනය :————.

07. දෙපාර්තමේන්තුගත විධායක නිලධාරී සේවා ගණයේ/ශ්‍රී ලංකා පරිපාලන සේවයේ I ශ්‍රේණියේ තනතුරක වසර 05 ක සක්‍රීය හා සතුටුදායක සේවා කාලය සම්පූර්ණ වන දිනය :————.

08. දෙපාර්තමේන්තුගත විධායක නිලධාරී සේවා ගණයේ /ශ්‍රී ලංකා පරිපාලන සේවයේ තනතුරක ………… දිනට සේවය කර ඇති මුළු සේවා කාලය :————.

09. යම් උසාවියකින් වරදකරුවෙකු වී තිබේද? :————.
එසේ නම් හේතු දක්වන්න :…………………………………………………………………………

10. වැටුප් රහිත නිවාඩු :

| අනු අංකය | වැටුප් රහිත නිවාඩු කාලය | නිවාඩුවේ ස්වභාවය (අදාළ ලේඛන ඇමිණිය යුතුයි.) |
|---|---|---|
| i. | | |
| ii. | | |

11. අධ්‍යාපන සුදුසුකම් : (පශ්චාත් උපාධිය සම්බන්ධ විස්තර)

| විශ්වවිද්‍යාලයේ නම | උපාධිය | උපාධියේ පංතිය | වර්ෂය |
|---|---|---|---|
| | | | |
| | | | |

12. අතිරේක සේවා පළපුරුද්ද (සහිතක කළ පිටපත් අමුණන්න.)

| තනතුර හා සේවා ස්ථානය | කාලය |
|---|---|
| | |
| | |
| | |

13. අතිරේක අධ්‍යාපන හා වෘත්තීය සුදුසුකම් (සහතික කළ පිටපත් අමුණන්න.)

| සම්පූර්ණ කර ඇති පුහුණු පාඨමාලා /වැඩසටහන්/වෘත්තීය සුදුසුකම් | කාලය |
|---|---|
| | |
| | |
| | |

14. ක්ෂේත්‍රය සඳහා දායකත්වය

| සපයා ඇති දායකත්වය | කාලය |
|---|---|
| | |
| | |
| | |

15. ඉංග්‍රීසි/පරිගණක පාඨමාලා (සහතික කළ පිටපත් අමුණන්න.)

| සම්පූර්ණ කර ඇති ඉංග්‍රීසි/පරිගණක පාඨමාලා | කාලය |
|---|---|
| | |
| | |
| | |

16. මෙම ඉල්ලුම්පත්‍රයේ මා විසින් සඳහන් කරන ලද සියළුම තොරතුරු සත්‍යවූත්, නිවැරදිවූත් ඒවා බව මෙයින් සහතික කරමි. මා මෙම තනතුරට තෝරාගැනීමට ප්‍රථම මෙහි සඳහන් කිසියම් තොරතුරක් අසත්‍ය බව හෙළි වුවහොත් මා නුසුදුස්සකු බවට පත්වන බවත්, තෝරා ගැනීමෙන් පසුව හෙළි වුවහොත් කිසිදු වන්දියක් නොගෙවා මා සේවයෙන් පහ කිරීමට යටත් වන බවත් මම දනිමි.

————,
අයදුම්කරුගේ අත්සන

දිනය :————.

17. අයදුම්කරුගේ අත්සන සහතික කිරීම (අදාළ නොවන වචන කපා හරින්න)

මෙම අයදුම්පත ඉදිරිපත් කරන ....................... මහතා/මහත්මිය/මෙනෙවිය මා පෞද්ගලික වශයෙන් දන්නා හඳුනන බවත්, ඔහු/ඇය ................. වැනි දින මා ඉදිරිපිට දී අත්සන් කළ බවත්, මෙයින් සහතික කරමි.

සහතික කරන්නාගේ අත්සන :————.
සහතික කරන්නාගේ සම්පූර්ණ නම :————.
තනතුර :————.
ලිපිනය :————.

නිලමුද්‍රාව :————.

දිනය :————.

***සටහන*** : අයදුම්පත් සහතික කළ යුත්තේ *ගැසට්* නිවේදනයේ 6 (iv) ඡේදයේ සඳහන් පරිදිය.

18. ආයතන ප්‍රධානියාගේ නිර්දේශය :

මෙම අයදුම්පත ඉදිරිපත් කරන.......................මහතා/මහත්මිය/මෙනෙවිය මෙම අමාත්‍යාංශයේ/ දෙපාර්තමේන්තුවේ/සංස්ථාවේ/මණ්ඩලයේ සේවයේ නියුතු අයකු වන අතර, ඔහු/ඇය ඉහත තනතුර සඳහා තෝරා ගනු ලැබුවහොත් මෙම ආයතනයේ සේවයෙන් නිදහස් කළ හැකිය./නොහැකිය.

————,
ආයතන ප්‍රධානියාගේ අත්සන
(නිල මුද්‍රාව)

දිනය :————.
ආයතන ප්‍රධානියාගේ නම :————.
තනතුර :————.
සේවා ස්ථානයේ ලිපිනය :————.

12-248

# විභාග, විභාග ප්‍රතිඵල ආදිය

## ආයුර්වේද වෛද්‍ය සේවයේ කාර්යක්ෂමතා කඩඉම් විභාගය - 2022 දෙසැම්බර්

ශ්‍රී ලංකා ආයුර්වේද වෛද්‍ය සේවයට අයත් වෛද්‍ය නිලධාරීන් සඳහා වන කාර්යක්ෂමතා කඩඉම් විභාගය ආයුර්වේද දෙපාර්තමේන්තුව මගින් පැවැත්වීමට කටයුතු යොදා ඇති බව මෙයින් නිවේදනය කරනු ලැබේ. මෙම විභාගය කොළඹ දී පැවැත්වේ.

01. ආයුර්වේද කොමසාරිස් විසින් විභාගය පැවැත්වීම සම්බන්ධයෙන් නියම කරන ලද නීති රීති වලට විභාග අපේක්ෂකයන් යටත් වේ.

02. ඉල්ලුම්පත්‍ර මෙම නිවේදනයට අමුණා ඇති ආදර්ශ ආකෘතිවලට අනුකූලව සකස් කර එවිය යුතුය. එම ආදර්ශ ආකෘතිය අනුව ශ්‍රී ලංකා ආයුර්වේද වෛද්‍ය සේවා ව්‍යවස්ථාවට අදාළව සුදුසුකම් ලබා ඇති අපේක්ෂකයින් ස්වකීය අයදුම් පත්‍රය පිළියෙල කළ යුතු අතර, එම අයදුම් පත්‍රය අපේක්ෂකයින් විසින් සිය ආයතන ප්‍රධානියා මගින් **2022.12.23** දිනට හෝ ඊට පෙර ලැබෙන සේ "ලේඛකාධිකාරී, විභාග අංශය, ආයුර්වේද දෙපාර්තමේන්තුව, නාවින්න, මහරගම "යන ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතුය. අයදුම්පත් එවනු ලබන ලියුම් කවරයේ වම්පස ඉහළ කෙළවරේ "ආයුර්වේද වෛද්‍ය සේවයේ කාර්යක්ෂමතා කඩඉම් විභාගය - 2022 දෙසැම්බර්" යනුවෙන් සඳහන් විය යුතුය. අයදුම් පත්‍රය කැඳවන දිනට පසුව ලැබෙන අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ.

03. පළමු වරට මෙම විභාගයට පෙනී සිටීමට කිසිදු ගාස්තුවක් ගෙවිය යුතු නොවේ. එසේකුදු වුවත්, ඉන්පසු වාරවලදී නිලධාරීන් විසින් එකවර සම්පූර්ණ විභාගයට පෙනී සිටින්නේ නම් රු.230/- ක් වටිනා මුදල් ගාස්තුවක් ද, එක් විෂයක් සඳහා පෙනී සිටින්නේ නම් රු.57.50 ක් වටිනා මුදල් ගාස්තුවක් ද ගෙවිය යුතු වේ. එම ගෙවිය යුතු මුදල මහරගම ලංකා බැංකු ශාඛාවේ අංක 7041294 ආයුර්වේද කොමසාරිස්ගේ ගිණුමට බැර කර ලදුපත අයදුම්පත සමග අමුණා එවිය යුතුය. කුමන කරුණක් යටතේ වුවද එම ගාස්තුව ආපසු ගෙවනු නොලැබේ.

"තමන්ගේ ලිපිනය නිවැරදිව ලියූ අඟල් 9 x 4 මුද්දර සහිත ලියුම් කවර දෙකක් අයදුම් පත්‍රය සමඟ එවිය යුතුය."

04. *අපේක්ෂකයන්ගේ අනන්‍යතාවය :-*

අපේක්ෂකයන් විභාග ශාලාව තුළදී සහ පෙනී සිටින සෑම විෂයක් පාසාම ආයුර්වේද දෙපාර්තමේන්තුව සෑහීමකට පත්වන පරිදි ස්වකීය අනන්‍යතාවය ඔප්පු කළ යුතුය. ඒ සඳහා පහත දැක්වෙන ලියකියවිලි අතරින් කුමක් වුවත් භාර ගනු ලැබේ.

i. පුද්ගලයින් ලියාපදිංචි කිරීමේ දෙපාර්තමේන්තුවේ කොමසාරිස් විසින් නිකුත් කරන ලද ජාතික හැඳුනුම්පත.

` ii. වලංගු විදේශ ගමන් බලපත්‍රය.

iii. වලංගු රියදුරු බලපත්‍රය.

05. **2020.10.27** දිනට පෙර සහ පසු පත්වීම් ලබා ගත් වෛද්‍ය නිලධාරීන්ට මෙම පරීක්ෂණයට අයදුම් කිරීමට සුදුසුකම් ලබයි.

06. අයදුම්පත් පිළිගන්නා ලද නිලධාරීන් වෙත ආයුර්වේද කොමසාරිස් විසින් විභාග කාලසටහන සහ ප්‍රවේශ පත්‍රය නිකුත් කරනවා ඇත. විභාගයට පෙනී සිටින නිලධාරීන් විසින් තම අත්සන නියමිත පරිදි සහතික කරවා ගන්නා ලද ප්‍රවේශපත්‍රය ආයුර්වේද දෙපාර්තමේන්තුවේ බලය යත් නිලධාරීන් වෙත ඉදිරිපත් කළ යුතුය. එවැනි ප්‍රවේශපත්‍ර නොමැතිව විභාගයට පෙනී සිටීමට ඉඩ දෙනු නොලැබේ. යම්කිසි නිලධාරියෙකුට විභාගය පැවැත්වීමට අඩු වශයෙන් දින හතකට (07) පෙර ප්‍රවේශ පත්‍රය නොලැබුණහොත්, ප්‍රවේශ පත්‍ර නොලැබුණ බව පහත සඳහන් විස්තර සමග "ලේඛකාධිකාරී, විභාග අංශය, ආයුර්වේද දෙපාර්තමේන්තුව, නාවින්න, මහරගම" යන ලිපිනයට වහාම දැන්විය යුතුය.

i. විභාගයේ නම :
ii. අයදුම්කරුගේ සම්පූර්ණ නමඃ
iii. අයදුම්කරුගේ ලිපිනයඃ
iv. අයදුම්පත්‍රය තැපැල් කළ තැපැල් කාර්යාලයේ නම සහ ලියාපදිංචි කුවිතාන්සියේ අංකය හා දිනයඃ

7. විභාග පටිපාටිය
(ශ්‍රී ලංකා ආයුර්වේද වෛද්‍ය සේවයට අයත් සේවා ව්‍යවස්ථාවට අනුකූලව)
i. මූල්‍ය ක්‍රම - පහත සඳහන් කරුණු මත පදනම් වූ එක් ප්‍රශ්න පත්‍රයක්

(අ). ශ්‍රී ලංකා ආණ්ඩුවේ මුදල් රෙගුලාසි I වැනි කාණ්ඩය (X පරිච්ඡේදය හැර)

ii. ආයතන රෙගුලාසි හා කාර්ය පරිපාටික නීති සංග්‍රහය - පහත සඳහන් කරුණු මත පදනම් වූ එක් ප්‍රශ්න පත්‍රයක්

(අ). ආයතන සංග්‍රහය සහ රාජ්‍ය සේවා කොමිෂන් සභා කාර්ය පරිපාටික රීති සංග්‍රහය

iii. ආරෝග්‍යශාලා පරිපාලනය - පහත සඳහන් කරුණු මත පදනම් වූ එක් ප්‍රශ්න පත්‍රයක්
(අ). ආරෝග්‍යශාලා පිළිබඳ බල පැවැත්වෙන සාමාන්‍ය නීතිරීති.
(ආ). ආරෝග්‍යශාලා පිරිසිදුව තබා ගැනීම.
(ඇ). රෝගීන් සම්බන්ධව බලපැවැත්වෙන නිතී රීති.
(ඈ). රෝගීන්ට නියමිත ආහාරපාන ලබා ගන්නා විධි.
(ඉ). ඖෂධ නිෂ්පාදනාගාර පාලනය.
(ඊ). රෝගීන් ඇතුළත් කිරීම සම්බන්ධයෙන් බලපැවැත්වෙන නීති රීති.
(උ). ආරෝග්‍යශාලාවල වෛද්‍ය අධිකාරිගේ සිට කණිෂ්ඨ සේවකයින් දක්වා ඔවුන්ට අයත් රාජකාරි පිළිබඳව ඇති අවබෝධය.
(ඌ). ආයුර්වේද දෙපාර්තමේන්තුවේ සාමාන්‍ය පාලන රෙගුලාසි.
(එ). ආයුර්වේද දෙපාර්තමේන්තුවේ ගබඩා ගිණුම්, ලිපි ලේඛන, පොත් පත් පවත්වාගෙන යාමට අදාළ රෙගුලාසි.
(ඔ). ආයුර්වේද දෙපාර්තමේන්තුවේ කාර්ය සංවිධාන සංග්‍රහය.
(ඕ). ආරෝග්‍යශාලාවල සාමාන්‍ය පාලන කටයුතු.

iv. *රාජ්‍ය භාෂා පරීක්ෂණය*

1996.05.20 ව්‍යවස්ථාවට අනුව 2020.10.27 දිනට පෙර පත්වීම් ලබා ගත් වෛද්‍ය නිලධාරීන්ට පමණක් මෙම පරීක්ෂණයට අයදුම් කිරීමට සුදුසුකම් ලබයි.

රාජ්‍ය භාෂා වාචික පරීක්ෂණය - සිංහල / දෙමළ (විනාඩි 15)

**සිංහල භාෂා මාධ්‍යයෙන් සේවයට බැඳුණු නිලධරයන් සඳහා**
(අ) දෙමළ භාෂාවෙන් අසන ප්‍රශ්නවලට දෙමළ භාෂාවෙන් පිළිතුරු දීම.
(ආ) දෙමළ භාෂාවෙන් අසන වාක්‍ය සිංහල භාෂාවෙන් ප්‍රකාශ කිරීම.
(ඇ) සිංහල භාෂාවෙන් අසන වාක්‍ය දෙමළ භාෂාවෙන් ප්‍රකාශ කිරීම.

**දෙමළ භාෂා මාධ්‍යයෙන් සේවයට බැඳුණු නිලධරයන් සඳහා**
(අ) සිංහල භාෂාවෙන් අසන ප්‍රශ්නවලට සිංහල භාෂාවෙන් පිළිතුරු දීම.
(ආ) සිංහල භාෂාවෙන් අසන වාක්‍ය දෙමළ භාෂාවෙන් ප්‍රකාශ කිරීම.
(ඇ) දෙමළ භාෂාවෙන් අසන වාක්‍ය වලට සිංහල භාෂාවෙන් ප්‍රකාශ කිරීම.

2020.10.27 පසු පත්වීම් ලබා ගත් වෛද්‍ය නිලධාරීන් 2020.10.27 සේවා ව්‍යවස්ථාව අනුව

| භාෂාව | ලබා ගත යුතු ප්‍රවීණතාවය |
|---|---|
| රාජ්‍ය භාෂාවක | රාජ්‍ය භාෂාවක් නොවන භාෂා මාධ්‍යකින් සේවයට බැඳුණු නිලධාරීන් නියමිත රාජ්‍ය භාෂා ප්‍රවීණතාවය පරිවාස කාලය තුළ ලබා ගත යුතු වේ. අ.පො.ස (සා / පෙළ) මවුබස සඳහා සාමාර්ථ සුදුසුකමක් ලබා ගැනීම මේ සඳහා ප්‍රමාණවත් වේ. |
| අනෙකුත් රාජ්‍ය භාෂාවක් | රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 01/2014 හා ඊට අනුශංගික චක්‍රලේඛ අනුව අදාළ මට්ටමේ ප්‍රවීණතාව ලබා ගත යුතුයි. |

v. විභාගය සමත් වීම සඳහා එක් එක් විෂයයට අවම වශයෙන් ලකුණු 40 ක් ලබා ගත යුතුය.
මෙම නිවේදනයේ සිංහල, දෙමළ හා ඉංග්‍රීසි භාෂා පාඨ අතර යම් අනනුකූලතාවයක් ඇති වුවහොත් එවිට සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු වන්නේ ය.

එස්. ජනක ශ්‍රී චන්ද්‍රගුප්ත,
ලේකම්.

සෞඛ්‍ය අමාත්‍යාංශය,
" සුවසිරිපාය"
385, පූජ්‍ය බද්දේගම විමලවංශ හිමි මාවත,
කොළඹ 10

ආදර්ශ අයදුම් පත්‍රය

ආයුර්වේද වෛද්‍ය සේවයේ කාර්යක්ෂමතා කඩඉම් විභාගය - 2022 දෙසැම්බර්

විභාග අංකය :
(කාර්යාල ප්‍රයෝජනය සඳහා පමණයි) [ ]

විභාගයට පෙනී සිටින මාධ්‍යය
(අදාළ අක්ෂරය කොටුව තුළ ලියන්න) [ ]

සිංහල- S දෙමළ- T

01. මුලකුරු සමග නම (Mr/Mrs/Miss)
(ඉංග්‍රීසි කැපිටල් අකුරෙන්) :————.

02. මුලකුරු සමග නම
(සිංහලෙන්/දෙමළෙන්) :————. මයා/ මිය/ මෙනෙවිය

03. මුලකුරුවලින් හැඳින්වෙන නම් (ඉංග්‍රීසි කැපිටල් අකුරෙන්) :————.

04. මුලකුරුවලින් හැඳින්වෙන නම්
(සිංහලෙන්/ දෙමළෙන්) :————.

05. ජාතික හැඳුනුම්පත් අංකය : | | | | | | | | | | | | |

06. i. සේවා ස්ථානය හා ලිපිනය
(ඉංග්‍රීසි කැපිටල් අකුරෙන්) :————.
ii. සේවා ස්ථානයට අයත් පළාත :————.

07. i. සේවා ස්ථානය හා ලිපිනය
(සිංහලෙන්/ දෙමළෙන්) :————.
ii. දුරකතන අංකය :————.

08. i. දැනට දරන තනතුර :————.
ii. පත්වීම් ලිපියේ අංකය හා දිනය :————.

09. ඔබ දැන් ඉදිරිපත් වන විෂය/ විෂයයන්

| *අනු අංකය* | *විෂයය* | *විෂය අංකය* |
|---|---|---|
| | | |
| | | |
| | | |
| | | |

ඔබ මින් ඉහත විභාගයක දී පහත සඳහන් විෂයයන් එකකින් හෝ කිහිපයකින් හෝ සමත් වී තිබේද? මුදල් රෙගුලාසි/ ආයතන සංග්‍රහය / ආරෝග්‍යශාලා පරිපාලනය/ වාචික පරීක්ෂණය (දෙමළ/ සිංහල) එසේ නම් විභාග අංකය, වර්ෂය සහ මාසය සඳහන් කරන්න.

| *විෂයය* | *විභාග අංකය* | *වර්ෂය හා මාසය* |
|---|---|---|
| | | |
| | | |
| | | |
| | | |

11. ඔබ විභාගයට පෙනී සිටින්නේ ප්‍රථම වතාවට ද? :————.
විභාගයට පෙනී සිටින්නේ ප්‍රථම වතාවට නොවේ නම් ගෙවන ලද මුදල් වටිනාකම.
(බැංකු රිසිට් පත මෙහි අලවන්න)

| |
|---|
| |

ඉහත සඳහන් විස්තර නිවැරදි බවත්, ඉහතින් දක්වා ඇති භාෂා මාධ්‍යයෙන් විභාගයට පෙනී සිටීමට මට හිමිකම් ඇති බවත් ප්‍රකාශ කරමි. මෙම විභාගය සඳහා පනවා ඇති නීති රීති පිළිබඳව මම එකඟ වෙමි.

————,
අපේක්ෂකයාගේ/අපේක්ෂිකාවගේ

අත්සන හා දිනය :————.

***සටහන*** :- තමාගේ දෙපාර්තමේන්තු ප්‍රධානියා හෝ එම දෙපාර්තමේන්තු ප්‍රධානියා වෙනුවට අත්සන් කිරීමට බලයලත් නිලධාරියෙකු ඉදිරිපිටදී අයදුම්කරු විසින් අත්සන් කළ යුතුය.

***අත්සන සහතික කිරීම***

මගේ කාර්යාලයේ නිලධාරියකු/නිලධාරිණියක සහ මා පෞද්ගලික වශයෙන් දන්නා හඳුනන ..........................................
මහතා/මහත්මිය/මෙනවිය ..................... වැනි දින මා ඉදිරිපිට දී අත්සන් කළ බව සහතික කරමි.

————,
සහතික කරන්නාගේ අත්සන සහ නිල මුද්‍රාව.

නම :————.
පදවි නාමය :————.
ලිපිනය :————.
දිනය :————.

12-299

## අධ්‍යාපන අමාත්‍යාංශය

## ශ්‍රී ලංකා විදුහල්පති සේවය සඳහා වූ ඉංග්‍රීසි භාෂා පරීක්ෂණය - 2022

අංක 1885/31 හා 2014.10.22 දිනැති ශ්‍රී ලංකා විදුහල්පති සේවා ව්‍යවස්ථාවට අනුව ශ්‍රී ලංකා විදුහල්පති සේවයේ නිලධාරීන් සඳහා වන ඉංග්‍රීසි භාෂා පරීක්ෂණය **2023 මාර්තු මස** කොළඹ දී පැවැත්වෙන බව මෙයින් දැනුම් දෙනු ලැබේ.

02. විදුහල්පති සේවයේ සෑම නිලධාරියකු ම බඳවා ගැනීමේ දින සිට වසර (03) ක් ඇතුළත සන්ධාන භාෂාව පිළිබඳ ප්‍රවීණතාව ලබා ගත යුතු ය. සේවා ව්‍යවස්ථාවේ සහ බඳවා ගැනීම් පටිපාටියේ සඳහන් පරිදි සන්ධාන භාෂා අවශ්‍යතාව සම්පූර්ණ කිරීම සම්බන්ධයෙන් නිකුත් කර ඇති රාජ්‍ය සේවා කොමිෂන් සභා චක්‍රලේඛ 08/2020 අනුව, ඉංග්‍රීසි මාධ්‍යයෙන් උපාධිය/පශ්චාත් උපාධිය සම්පූර්ණ කරන ලද නිලධාරීන්, අ. පො. ස. (උ.පෙළ) විභාග යේදී ඉංග්‍රීසි විෂයය (අතිරේක විෂයක් ලෙස නොවන පරිදි) සමත්ව ඇති නිලධාරීන්, අ.පො.ස. (සා. පෙළ) විභාගයේ දී ඉංග්‍රීසි විෂයය (අතිරේක විෂයයක් ලෙස නොවන පරිදි) සම්මාන සාමාර්ථයක් හෝ ඊට ඉහළ සාමාර්ථයක් ලබා ඇති නිලධාරීන් ඉංග්‍රීසි භාෂා පරීක්ෂණය සමත් වීමේ අවශ්‍යතාවෙන් නිදහස් කරනු ලැබේ. සෙසු නිලධාරින් මෙම පරීක්ෂණය සමත් විය යුතු ය.

03. මෙම විභාගයට අදාළ විෂය නිර්දේශය හා අනෙකුත් විධිවිධාන අංක 1885/31 දරන 2014.10.22 දිනැති ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *අති විශෙෂ ගැසට්* පත්‍රයේ පළ කර ඇත. ඉංග්‍රීසි භාෂා පරීක්ෂණය එක් ප්‍රශ්න පත්‍රයකින් සමන්විත වන අතර, අයදුම්කරුවන්ගේ පහසුව සඳහා එම විෂය නිර්දේශය හා අනෙකුත් විධිවිධාන පහත දක්වා ඇත.

(අ) *විභාග පටිපාටිය*

| විෂය අංකය | විෂය | කාලය | ලකුණු | සමත් වීමට |
|---|---|---|---|---|
| 01 | සාමාන්‍ය ඉංග්‍රීසි (General English) | පැය 3 | 100 | අවශ්‍ය අවම ලකුණු 40 |

***විෂය නිර්දේශය*** :

Suitable level of proficiency on the following forms of grammar in the written language is expected from the candidate.

- Tenses and Numbers
- Sentences (Simple/Compound/Complex/ Compound Complex)
- Relative Clauses
- Reported Speech
- Adjectives and Adverbs
- Determiners
- Prepositions

The Knowledge on the modern formats and styles of writing is tested in following area of study.

- Summary writing
- Report writing
- Essay Writing

04. සාමර්ථය ලැබීම සඳහා මෙම විෂයයට අපේක්ෂකයකු අවම වශයෙන් 40% ක හෝ ඊට වැඩි ලකුණු ප්‍රමාණයක් ලබා ගත යුතු ය.

4.1. විභාගයට පෙනී සිටි සියලුම අයදුම්කරුවන්ගේ ප්‍රතිඵල ඇතුළත් ප්‍රතිඵල ලේඛනය ලේකම්, අධ්‍යාපන අමාත්‍යාංශය වෙත ලබා දෙනු ඇත. විභාග අපේක්ෂකයින් වෙත පෞද්ගලික ප්‍රතිඵල ලේඛන නිකුත් කිරීම විභාග කොමසාරිස් ජනරාල් විසින් සිදු නොකරනු ඇත.

05. පහත දැක්වෙන ආකෘතියට අනුව, ඉල්ලුම් පත්‍රයේ අංක **01 සිට 04** තෙක් වූ ශීර්ෂ පළමුවන පිටුවට ද ඉතිරිය අනෙක් පිටුවලට ද ඇතුළත් වන පරිදි ඉල්ලුම් පත්‍රය සකස් කළ යුතු අතර ඊට අදළ තොරතුරු විභාගයට ඉල්ලුම් කරන මාධ්‍යයෙන් තම අත් අකුරින් ම පැහැදිලිව සම්පූර්ණ කළ යුතුය. සම්පූර්ණ කරන ලද ඉල්ලුම් පත්‍රයේ ඡායා පිටපතක් ළඟ තබා ගැනීම ප්‍රයෝජනවත් වනු ඇති බව දන්වමි. තව ද සම්පූර්ණ කරනු ලබන ඉල්ලුම් පත්‍රය විභාග නිවේදනයේ සඳහන් ආදර්ශ ඉල්ලුම් පත්‍රයට අනුකූලද යන්න පිළිබඳව අයදුම්කරු විසින් විමසා බැලිය යුතු අතර ආදර්ශ ඉල්ලුම් පත්‍රයට අනුකූල නොවන ඉල්ලුම් පත්‍ර හා අසම්පූර්ණ ලෙස තොරතුරු සඳහන් කර ඇති ඉල්ලුම් පත්‍ර දැනුම් දීමකින් තොරව ප්‍රතික්ෂේප කෙරේ. තව ද ඉල්ලුම් පත්‍රය යොමු කිරීමට ප්‍රථම නියමිත විභාග ගාස්තු ගෙවා එහි විස්තර ඉල්ලුම් පත්‍රයට ඇතුළත් කොට ලදුපත අලවා ඇත් ද යන්න පිළිබඳ නැවත විමසිලිමත් විය යුතු බවත්, සම්පූර්ණ කරන ලද ඉල්ලුම් පත්‍රයේ හා විභාග ගාස්තුවට අදළ ලදුපතේ ඡායා පිටපතක් ළඟ තබා ගැනීම ප්‍රයෝජනවත් වනු ඇති බවත් දන්වමි. ඉල්ලුම්පත්‍රය පිළියෙළ කර ගන්නා විට එහි ශීර්ෂයේ සඳහන් විභාගයේ නම සිංහල ඉල්ලුම්පත්‍රවල සිංහලට අමතරව ඉංග්‍රීසියෙන් ද, දෙමළ ඉල්ලුම්පත්‍රවල දෙමළට අමතරව ඉංග්‍රීසියෙන් ද යෙදීම අවශ්‍ය බව දන්වමි.

06. විභාග කොමසාරිස් ජනරාල් විසින් විභාගය පවත්වනු ලබන අතර එය පැවැත්වීම සඳහා ඔහු විසින් පනවා ඇති නීති රීති පිළිපැදීමට අපේක්ෂකයෝ බැඳී සිටිති. විභාගය සඳහා වන නීතිරීති මෙම නිවේදනය අවසානයේ පළ කොට ඇත.

07. ඉල්ලුම් පත්‍ර 2023 ජනවාරි මස 16 වැනි දින හෝ ඊට ප්‍රථම, "විභාග කොමසාරිස් ජනරාල්, ආයතනික විභාග සංවිධාන ශාඛාව, ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව, තැ. පෙ. 1503, කොළඹ" ලිපිනයට ලැබෙන පරිදි විදුහල්පති/කොට්ඨාස අධ්‍යාපන අධ්‍යක්ෂ/කලාප අධ්‍යාපන අධ්‍යක්ෂ හෝ අතිරේක පළාත් අධ්‍යාපන අධ්‍යක්ෂ/පළාත් අධ්‍යාපන අධ්‍යක්ෂ මගින් හෝ ඔබේ සේවා ප්‍රධානියා මගින් ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතු ය. ඉල්ලුම්පත්‍රය බහා එවන ලියුම් කවරයේ වමත්පස ඉහළ කෙළවරේ විභාගයේ නම පැහැදිලිව ලිවිය යුතු අතර මෙදිනට පසු එවනු ලබන ඉල්ලුම් පත්‍ර ප්‍රතික්ෂේප කරනු ලැබේ.

08. අයදුම්කරුවන් වෙත ප්‍රවේශ පත්‍ර නිකුත් කළ වහාම ඒ බව සඳහන් කරමින් නිවේදනයක් පුවත්පත්වල හා ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුවේ නිල වෙබ් අඩවියේ පළ කරනු ඇත. එම නිවේදනය පළ වී දින 02ක් හෝ 03ක් ගතවූ පසුවත් ප්‍රවේශ පත්‍රය නොලැබුණි නම් එම දැන්වීමේ සඳහන් ආකාරයට ඒ බව ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව වෙත දන්වා සිටිය යුතු ය. එසේ දැන්වීමේ දී අයදුම්කරුගේ සම්පූර්ණ නම, ලිපිනය, ජාතික හැඳුනුම්පත් අංකය හා අයදුම්කළ විභාගයේ නම සඳහන් කළ යුතු ය. කොළඹින් බැහැර අයදුම්කරුවකු නම් එම විස්තර සමග ප්‍රවේශ පත්‍රයේ පිටපතක් එවිය හැකි ෆැක්ස් අංකයක් ද සහිත ඉල්ලීමේ ලිපියක් දැන්වීමේ සඳහන් ෆැක්ස් අංකය වෙත යොමු කර විමසීම වඩාත් ඵලදායී වේ. විභාග දෙපාර්තමේන්තුවෙන් විමසන අවස්ථාවේ අවශ්‍ය වුවහොත් අයදුම්කරුගේ අපේක්ෂකත්වය තහවුරු කිරීම සඳහා තමා ළඟ තබාගත් අයදුම්පතේ පිටපත, විභාග ගාස්තු ගෙවීම අදාළ වේ නම් ඒ සඳහා වූ ලදුපතේ පිටපත හා අයදුම්පත තැපැල් කිරීමේ දී ලියාපදිංචි කරන ලද කුවිතාන්සිය ද සූදානමින් තබා ගැනීම ප්‍රයෝජනවත් වනු ඇත. අපේක්ෂකයකුට විභාග ප්‍රවේශ පත්‍රයක් නිකුත් කිරීම ඔහු හෝ ඇය විභාගයට ඉදිරිපත් වීමට සුදුසුකම් සපුරා ඇති බවට පිළිගැනීමක් ලෙස නොසැලකිය යුතු ය.

09. ඉල්ලුම් පත්‍රයේ ද විභාගය සඳහා වන ප්‍රවේශ පත්‍රයේ ද අයදුම්කරුගේ අත්සන ආයතන ප්‍රධානියා හෝ ඔහු විසින් බලය පවරන ලද නිලධාරියකු ලවා සහතික කර තිබිය යුතුය. අපේක්ෂකයකු තමාට නියම කර ඇති විභාග ශාලාවේ දී නියමිත විභාග අංකය යටතේ විභාගයට පෙනී සිටිය යුතු අතර විභාග දින තම අත්සන සහතික කරවාගත් ප්‍රවේශ පත්‍රය ශාලාධිපති වෙත භාර දිය යුතුය. තම ප්‍රවේශ පත්‍රය ඉදිරිපත් නොකරන අපේක්ෂකයකුට විභාගයට පෙනී සිටීමට අවසර දෙනු නොලැබේ.

10. විභාග අපේක්ෂක/අපේක්ෂිකාවන් විභාග ශාලාව තුළ දී තමන් පෙනී සිටින සෑම විෂයක් සඳහා ම ශාලාධිපති සෑහීමකට පත්වන පරිදි ස්වකීය අනන්‍යතාව සනාථ කළ යුතු ය. ඒ සඳහා පහත දැක්වෙන කවර ලියවිල්ලක් හෝ භාර ගනු ලැබේ.

i. ජාතික හැඳුනුම්පත,
ii. වලංගු විදේශ ගමන් බලපත්‍රය,
iii. වලංගු ශ්‍රී ලාංකික රියැදුරු බලපත්‍රය.

එමෙන්ම විභාග අපේක්ෂකයින් අනන්‍යතාව තහවුරු කර ගත හැකිවන පරිදි මුහුණ හා දෙකන් ආවරණය කිරීමෙන් තොරව විභාග ශාලාවට ඇතුළු විය යුතු ය. එසේ තම අනන්‍යතාව සනාථ කිරීම ප්‍රතික්ෂේප කරන අයදුම්කරුවන් විභාග ශාලාවට ඇතුළත් කර නොගැනේ. තව ද, විභාග ශාලාවට ඇතුළු වූ මොහොතේ සිට විභාගය අවසන් වී ඉන් පිටවන තෙක් විභාග බලධාරීන්ට අයදුම්කරු හඳුනාගත හැකි පරිදි මුහුණ හා දෙකන් ආවරණය කිරීමෙන් තොරව සිටිය යුතු ය.

11. *විභාග ගාස්තු* :

(*අ*) මෙම විභාගය සඳහා අයකරන ලද ගාස්තු මොනයම් හේතුවක් මත හෝ ආපසු ගෙවනු නොලබන අතර වෙනත් විභාගයක ගාස්තුවකට මාරු කිරීමට ද ඉඩදෙනු නොලැබේ. තව ද විභාග ගාස්තුව සඳහා මුදල් ඇණවුම් හෝ මුද්දර භාරගනු නොලබන අතර විභාග ගාස්තු ගෙවන ලද ලදුපතේ ඡායා පිටපතක් ළඟ තබා ගැනීම ප්‍රයෝජනවත් වනු ඇත.

(*ආ*) පළමුවැනි වතාවේදී ගාස්තු අයකරනු නොලැබේ.

(*ඇ*) ඊට පසු එක් එක් වතාව සඳහා රු. 250.00 බැගින් අය කරනු ලැබේ.

මෙම විභාග ගාස්තුව විභාග කොමසාරිස් ජනරාල්ගේ ආදායම් ශීර්ෂය 20-03-02-13ට බැරවන ලෙස දිවයිනේ පිහිටි ඕනෑම තැපැල් කාර්යාලයකට ගෙවා ලබා ගන්නා ලදුපත අයදුම්පත නියමිත ස්ථානයේ නොගැලවෙන සේ අලවා එවිය යුතු ය. ලදුපතේ ඡායා පිටපතක් ළඟ තබා ගැනීම ප්‍රයෝජනවත් වනු ඇත.

12. විභාගය පැවැත්වීම හා ප්‍රතිඵල නිකුත් කිරීම සම්බන්ධයෙන් විභාග කොමසාරිස් ජනරාල් විසින් පනවනු ලබන නීතිරීතිවලට විභාග අපේක්ෂකයින් යටත් වේ. එම නීතිරීති උල්ලංඝනය කළහොත් විභාග කොමසාරිස් ජනරාල් විසින් පනවනු ලබන දඬුවමකට යටත් වීමට ඔහුට හෝ ඇයට සිදුවනු ඇති බව දන්වමි. තව ද රටේ පවතින නිරෝධායන නීතිරීතිවලට ද අපේක්ෂකයින් යටත් විය යුතු වේ.

13. සිංහල, ඉංග්‍රීසි හා දෙමළ මාධ්‍යයන්ගෙන් පළවන මෙම නිවේදනයේ භාෂා පාඨ අතර කිසියම් නොගැළපීමක් හෝ අනනුකූලතාවයක් ඇති බව පෙනී යන්නේ නම් එවැනි අවස්ථාවක සිංහල මාධ්‍ය නිවේදනයට අනුව කටයුතු කරනු ලැබේ.

14. තව ද මෙම නිවේදනය මගින් ආවරණය නොවන කිසියම් කාරණයක් වෙතොත් ඒ පිළිබඳව තීරණය කිරීමේ අයිතිය අධ්‍යාපන අමාත්‍යාංශයේ ලේකම්වරයා සතු ය.

එම්. එන්. රණසිංහ,
ලේකම්,
අධ්‍යාපන අමාත්‍යාංශය.

නොවැම්බර් මස 25 වැනි දින,
පැලවත්ත, ඉසුරුපාය, අධ්‍යාපන අමාත්‍යාංශයේ දී ය.

**ආදර්ශ අයදුම්පත**

***ශ්‍රී ලංකා විදුහල්පති සේවය සඳහා වූ ඉංග්‍රීසි භාෂා පරීක්ෂණය - 2022***

English Language Test for the Sri Lanka Principals Service - 2022

(විදුහල්පති/කොට්ඨාස හෝ කලාප අධ්‍යාපන අධ්‍යක්ෂ/අතිරේක පළාත් අධ්‍යාපන අධ්‍යක්ෂ/පළාත් අධ්‍යාපන අධ්‍යක්ෂ මගින් විභාග කොමසාරිස් ජනරාල්, (ආයතනික විභාග) ශාඛාව, ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව, තැ. පෙ. 1503, කොළඹ, වෙත ලියාපදිංචි තැපෑලෙන් ඉදිරිපත් කරන්න. විභාගයේ නම කවරයේ වමත් පස ඉහළ කෙළවරේ සඳහන් කළ යුතුය.)

1. (අ) සම්පූර්ණ නම ඃ
(ඉංග්‍රීසි කැපිටල් අකුරින්)
(ආ) සම්පූර්ණ නම (සිංහලෙන්/දෙමළෙන්) :————.

2. ලිපිනය ඃ
(i) පෞද්ගලික :————.
(ii) රාජකාරි :————.
(iii) ප්‍රවේශ පත්‍රය එවිය යුතු ලිපිනය :————.
(ඉංග්‍රීසි කැපිටල් අකුරින්)

3. (i) ස්ත්‍රී/පුරුෂ භාවය ඃ ස්ත්‍රී - 1
පුරුෂ - 0
(අදාළ අංකය කොටුව තුළ ලියන්න.)

(ii) ජාතික හැඳුනුම්පත් අංකය ඃ

(iii) උපන් දිනය ඃ

වර්ෂය : මාසය : දිනය :

4. දුරකථන අංකය :

(i) ජංගම ඃ

(ii) ස්ථාවර ඃ

5. (i) විදුහල්පති සේවයේ පන්තිය/ශ්‍රේණිය :————.
(ii) පාසල/කාර්යාලය :————.
(iii) පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව/කලාප අධ්‍යාපන කාර්යාලය :————.

6. විභාග ගාස්තු ගෙවා ලබාගත් ලදුපතේ විස්තර ඃ

ලදුපත් අංකය :————.
තැපැල් කාර්යාලය :————.
දිනය :————.

| ලදුපත මෙහි අලවන්න. |
|---|

ඉහත සඳහන් තොරතුරු නිවැරදි බව ප්‍රකාශ කරමි. තව ද, විභාගය පැවැත්වීම සම්බන්ධයෙන් විභාග කොමසාරිස් ජනරාල් විසින් පනවනු ලබන නීතිරීතිවලට මා එකඟ වෙමි.

————,
අයදුම්කරුගේ අත්සන.

දිනය :————.

විභාග කොමසාරිස් ජනරාල්,

ඉහත විස්තරය දක්වෙන අපේක්ෂකයා මගේ පාසලේ/කාර්යාලයේ නිලධාරියකු බව සහතික කරමි. තවද අපේක්ෂකයා විභාග ගාස්තුවෙන් නිදහස් බවද/අපේක්ෂකයා විභාග ගාස්තු සඳහා වන ලදුපත නිවැරදිව අලවා ඇති බව ද සහතික කරමි.

————,
විදුහල්පතිගේ/කොට්ඨාස හෝ කලාප අධ්‍යාපන අධ්‍යක්ෂගේ/අතිරේක පළාත් අධ්‍යාපන අධ්‍යක්ෂගේ/පළාත් අධ්‍යාපන අධ්‍යක්ෂගේ අත්සන.

(විදුහල්පතිවරයකු නම් පාසලේ නම සඳහන් කරන්න.)
(නිල මුද්‍රාවෙන් සනාථ කරන්න.)

ලිපිනය :————.
දිනය :————.

(අදාළ නොවන වචන කපා හරින්න.)

12-233

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.